# Research Abstracts

## International Research Symposium 2022

**Faculty of Music,**
**University of the Visual and Performing Arts,**
**Colombo 07, Sri Lanka.**

**ISBN 978-624-5785-18-6**

**Editor in Chief**

Professor Iranga Samindani Weerakkody

**Abstract Reviewing and Editing**

Professor Ranjith Fernando
Professor Kolitha Bhanu Dissanayake
Dr. Saman Panapitiya
Professor Iranga Samindani Weerakkody
Dr. Chinthaka Meddegoda
Dr. Ruwin Dias
Mahinda Senevirathna
Chiltas Dayawansha
Charudaththe B. Ilangasinghe

**Assistant Editors**

Dasith Tilakaratna
Niluka Thilakarathne

**Book Cover**

Samitha Rukmal Samarathunga

**Published By**

Faculty of Music,
University of the Visual and Performing Arts,
Colombo 07, Sri Lanka.
2022

**Organized by:** C. De S. Kulathilake Archival and Research Unit, UVPA

**Sponsored by:** The AHEAD Project AHEAD

# Research Abstracts

## International Research Symposium 2022

**Faculty of Music,**
**University of the Visual and Performing Arts,**
**Colombo 07, Sri Lanka.**

## Symposium Chair

Dr. Saman Panapitiya

## Symposium Chief Coordinator

Professor Iranga Samindani Weerakkody

## Symposium Secretary

Niluka D. Thilakarathne

## Session Chairs

Senior Professor Raj Somadeva
Professor Kolitha Bhanu Dissanayake
Professor Mudiyanse Dissanayake
Professor Jayantha Jayasiri
Professor Praneeth Abhayasundare
Professor Sriyani Rajapaksha
Professor Karunarathna Bandara
Professor Saumya Liyanage
Professor Indika Ferdinando
Professor Ranjith Fernando
Dr. Saman Panapitiya
Dr. Lasanthi Manaranjanie
Dr. Chinthaka Meddegoda
Dr. Ruwin Rangeeth Dias

## Program Committee

Senior Professor Raj Somadeva
Professor Kolitha Bhanu Dissanayake
Professor Ranjith Fernando
Charudaththe B. Ilangasinghe
Mahinda Senevirathne
Chiltas Dayawansha
D. Chanaka Peiris
Dr. Chinthaka Meddegoda
Dr. Ruwin Rangeeth Dias
Dr. Nishshanka Abeyrathna

# Organizing Committee

D.A.C. Atapattu
Ashoka Indunil
Mangalika Rajapaksha
Chandralal Amarakoon
Kamani Samarasinghe
A.M.R.S. Alagiyawanna
Kelum Sanjeewa Kularathne
Hemantha Manohari Randunuge

# Sub Organizing Committee

E. K. Dasun Nayanajith,
Upul Prabhashana
Nandana Wijenama
Sachintha Maduranga
Buddima Niyuni
Samitha Samarathunga,
Rachika de Silva
Tharindu Wijerathne
Nimna Preshni Sugathsiri
Thushari Bolukandura
Bewmani Bhagya
Isindi Amarasinghe
Iroshani Bandara
Asangi Ransika
Anjula Nadeeshani
H.P.G.D.H Alwis
Buddhika Jayathissa
Rajini Karunarathne
Dhammika kumari
Isuru Dananja Jayathilake
Pawara Nawamina
Pamalka Manjitha Karunanayake
Harendra Deshapriya
Tonisha Piyumi Bhagya
Milakshi Gunathilake
Imasha Assalla
Nimanthika Rathnayaka
Dammika Chaminda

Savinda Senanayake
M.D. Janani Anushika Gunathilaka
B. Ruvini Dilrukshi
U.G.P.Harshana
Asela Kulathunga
Sandali Yapa Abeywardana
S.I.M. Ranushi Sathsarani Ilangakoon
Harshika Mayuramali

# Contents


- Message from the Vice-Chancellor,
  Senior Professor (Dr.) Rohana P Mahaliyanaarachchi
- Message from the Dean of the Faculty of Music,
  Dr. Saman Panapitiya
- Message from the Chief Coordinator,
  Professor (Dr.) Iranga Samindani Weerakkody
- Keynote Address by Professor Svanibor Pettan,
  University of Ljubljana, Slovenia.
- List of Abstracts
- Abstracts
- Schedule of Symposium
- Acknowledgement

## Vice Chancellor's
# Message



It's my pleasure to issue a message as the Vice Chancellor of the University of the Visual and Performing Arts. At the outset, I would like to warmly welcome all the participants to the "International Research Symposium 2022" (IRS) of the Faculty of Music. I strongly believe that this symposium will inculcate a research culture in the university and foster inter-faculty collaborative research in the future.

As we are all aware, research projects plays a crucial role in the development of the country.

There is a strategic importance to the fact that universities, corporations, and industrial players both nationally and internationally should initiate and perform more research studies to address and find solutions to the problems faced by Sri Lanka and the rest of the world. The abstracts submitted to this symposium were written by researchers around the world in music disciplines. I believe that this International Research Symposium-2022 will critically discuss the research outcomes and come up with effective solutions, as well as establish a good collaboration between universities, corporations, and industrial firms located nationally and internationally to address the current issues faced by us. Although changes happen in the world and to what is considered as the new normal, the responsibility of a successful researcher is to uplift human life standards while preserving them for future use as well.

Finally, I would like to thank the distinguished keynote speakers, reviewers, students, and participants. I also wish the organizing committee of the symposium and all staff members of the Faculty of Music for organizing their International Research Symposium-2022, successfully.

**Senior Professor Rohana P. Mahaliyanaarachchi**
Vice - Chancellor
University of the Visual and Performing Arts

# Message

## From the Dean,
## Faculty of Music



On behalf of the Faculty of Music, I would like to convey my best wishes to the International Research Symposium on Music (IRS) 2022, organized by the C.de.S. Kulathilake Archival and Research Unit of the University of Visual and Performing Arts. As you are all aware, this symposium is a flagship event of the faculty of music and contributes to the enhancement of the university's research culture. This symposium brings together academics, scholars, researchers, and students to discuss and share the findings of current research, generating critical thinking and engaging in intellectual debate. I am of the view that in the current national context, it is important that all the faculties take a leading role in constructive social change. As such, I believe that this year’s symposium will be an important platform to effect social change while contributing relevant and transformational knowledge production. I take this opportunity to extend my gratitude to the symposium committee for their dedication and commitment to making this event a success. I also express my sincere thanks to the stakeholders for their valuable support in helping us make this research symposium a reality.

I wish all the participants a fruitful and rewarding symposium.

**Dr. Saman Panapitiya**
Dean,
Symposium Chair
Faculty of Music
University of Visual and Performing Arts

# Message

## From the
## Chief Coordinator



It is of great pleasure that I address this message, as the Director of the C. De S. Kulathilaka Research and Archival Unit. This symposium has multiple aims, in hopes to serve a variety of interconnected academic communities as well as disciplines within our University system. Firstly, we aim to motivate and create a platform for students to conduct research and present their findings through this symposium. This is of great importance as it furthers the research culture established within the Faculty of Music. Apart from academic skills, this symposium would also help undergraduate students to further develop their research-based writing and communication skills as well as to inculcate the importance of teamwork. By including the ability for academic staff too to participate, we have successfully broadened the scope of the symposium.

The symposium proceedings were mainly focused on to a few tracks surrounding the broad study areas offered by the Faculty of Music. These are to name a few, *"Musical aspects of various styles of music in the world"*, *"Historical and stylistic impact on musicology and ethnomusicology"*, *"Pedagogical aspects of music teaching and learning trends"*, and *"Effectiveness of music technology on applied music"*. A gathering of undergraduates, national academic professionals, and international academic professionals, totaling to a number of 79 individuals presented 75 abstracts and researches at this symposium.

With funding from the AHEAD Project in Sri Lanka, and the vast variety of academic subjects brought to the symposium from its valued participants, it is my belief that the symposium will be a great success.

I would like to show my heartfelt gratitude and thank the honored Chief Guest of the symposium, the Vice-Chancellor of the University of the Visual and Performing Arts, Senior Professor (Dr.) Rohana P. Mahaliyanaarachchi, the Chair of the symposium, the Dean of the Faculty of Music, Dr. Saman Panapitiya, the Deans of

all the other Faculties of the University of the Visual and Performing Arts, the Heads of all the Departments of the Faculty of Music and their respective academic staff, the Registrar, Bursar and their staff for the kind cooperation, the Keynote Speaker of our symposium, Professor Svanibor Pettan, the Professors, senior academics and scholars from a number of Universities who were the session chairs on the symposium, and for their fullest support rendered towards the success of the symposium, the Reviewers of the abstracts for their time and effort taken to moderate and evaluate the abstracts submitted to the symposium, and the members of the program committee, main organizing committee, sub organizing committee, and the students of the faculty of music who volunteered to support and ensure the success of the symposium.

Apart from the mentioned individuals, I would also like to thank the sponsors for this symposium, the AHEAD Project, for their support, the students and lecturers of the Faculty of Music and the Faculty of Dance and Drama for their active participation in the cultural program, the official media network of the University of the Visual and performing Arts, VAPA TV for their excellent media coverage, the Head of the IT Department and the staff for their valuable support in coordinating and handling the technical aspects of the symposium, the Secretary of the symposium, Niluka Thilakaratne, and most importantly the international academic scholars, local academic scholars, and undergraduate students for presenting their research presentations at the symposium.

**Professor Iranga Samindani Weerakkody**
Chief Coordinator,
International Research Symposium 2022.
Director,
CDSK Archival and Research Unit,
University of the Visual and Performing Arts.

# Keynote Address




Professor Svanibor Pettan

TO BE AN ETHNOMUSICOLOGIST

While pointing to different aspects of what it takes to be an ethnomusicologist in today's world, Prof. Pettan provides comments on each of the eight themes of the Student Research Symposium and takes into consideration the four aims defined for the event. He shares his diverse experiences in academia, media, and professional associations with the wish to encourage the students to follow their dreams in building their careers. By using both positive and negative experiences from his own research path and a selection of published sources, he provides helpful practical advices and guidelines for the emerging young scholars.

Svanibor Pettan is a Professor and the Chair in Ethnomusicology at the University of Ljubljana, Slovenia. He is the President of the International Council for Traditional Music (ICTM) and chairperson of its Study Group on Music and Minorities. His research and pedagogical experiences on five continents are reflected in more than a hundred guest lectures in 40 countries, several visiting professorships world-wide and publications in different formats and languages. He is currently a Maestro Premasiri Kemadasa Adjuct Professor in music at UVPA.

# List of Abstracts

| Author | Topic | Page |
| --- | --- | --- |
| **Abeysekara, G. G. G. L** | A study of "Nirgun tradition and Kabir bhajans". | **106** |
| **Abeywardana, S. Y.** | Behavior of music in International Relations ; A musical approach for peace and conflict resolutions | **34** |
| **Alagiyawanna, A. M. R. S. K.** | උත්තර භාරතීය වාද්‍ය වේදයෙහි ක්‍රම ශිල්ප බිහිකිරීමෙහිලා ධ්‍රැපද් ගායන ශෛලියෙන් ලද ආභාසය. | **84** |
| **Amarakoon, A. M. C.** | ශ්‍රී ලාංකේය ජනප්‍රිය සංගීත ක්ෂේත්‍රයේ තාල 'නාමකරණය' | **55** |
| **Arachchige, G. G. K. D.** | මාතර සම්ප්‍රදායේ ගම්මඩු ශාන්තිකර්ම ආශ්‍රිත උඩැක්කි ගායන හා වාදන විධි | **36** |
| **Atapattu, D. A. C.** | A Practical Study of the Peculiarities of Khyals by Pandit Ramdas Mishra (Bade Ramdas) of Banaras Gharana. | **51** |
| **Bhagya, D. M. B.** | Aspects and the effectiveness of music therapy on human behavior | **67** |
| **Chandrasiri, A. S. K.** | ගෙස්ටෝල්ට්වාදයට අනුව සංගීත පෙලඹවීම මිනිස් මනසේ ක්‍රියාකාරිත්වය කෙරෙහි බලපාන ආකාරය | **27** |
| **Dayawansha, C.** | උත්තර භාරතීය ශාස්ත්‍රීය සංගීත අභිවහනයේ දී යෝජිත ආසන ක්‍රමවල (Sitting Posture) සහ යෝග ශාස්ත්‍රයෙහි භාවිත කෙරෙන යෝගාසන අතර විද්‍යමාන සම්බන්ධතාව | **114** |
| **Dehideniya, I. B.** | ක්‍රිස්තු වර්ෂ 1232-1815 අතර කාලපරිච්ඡේදයේ දී ශ්‍රී ලංකාවේ ව්‍යාප්තව පැවති තන්ත්‍රීය වාද්‍ය භාණ්ඩ (Stick zithers/ Tube zithers) | **24** |
| **Deshapriya, P. H. S.** | සතත අභ්‍යාසයේ දී නිවැරදි හා විධිමත් තාක්ෂණික ක්‍රමවේද භාවිතය (තබ්ලා වාද්‍ය භාණ්ඩය ඇසුරින්) | **74-75** |

| | | |
|---|---|---|
| **Dulakshana, A. I.** | ගායන රියැලිටි කලාව තුළින් බිහිවන ශිල්පීන්ගේ සංගීතමය අනාගතය පිළිබඳ අධ්‍යයනයක් | **32** |
| **Edirisooriya, E. M. I.** | The competence in classical music skills can be enriched through the process of continuous assessments: a study based on students of the faculty of music – UVPA | **72** |
| **Fernando, A. M. H. K.** | හින්දුස්තානි ශාස්ත්‍රීය සංගීත භාවිතය තුළ වයලිනයේ නව ප්‍රවණතා | **92** |
| **Guha, S.** | Music Therapy-An aid to well-being | **78** |
| **Gunarathne, T. D.** | ශ්‍රී ලංකාවේ උඩරට නර්තන සම්ප්‍රදායෙහි කලඑළි මංගල්‍යය පිළිබඳ ගුණාත්මක පර්යේෂණයක් | **83** |
| **Gunasekara, H. D. E.** | ළමා ලිංගික අපරාධ වාර්තාකරණයෙහි ලා ශ්‍රී ලාංකේය ජනමාධ්‍යයෙහි භාවිත විධික්‍රමයන්හි නෛතික උපයෝජන සක්‍රියතා | **96** |
| **Gunawardana, P.N.** | සංචාරක කර්මාන්තයඃ තංගල්ල ආශ්‍රිත කුඩා සංගීත කණ්ඩායම් පිළිබඳ ක්ෂේත්‍ර අධ්‍යයනයක් | **113** |
| **Illangasinghe, C. B.** | Electro acoustic Music as an Abstract Art Form (Producing Electro-acoustic compositions as an abstract Art of Music by using subdivided parts of tones of Sri Lankan Ethnic Musical Instruments) | **71** |
| **Jayasena, E. M. N. D.** | සබරගමු නර්තන කලාවේ වත්මන් ප්‍රාසංගික මුහුණුවර | **49** |
| **Kandage, R. U.** | පහතරට බෙර වාදනයේ ප්‍රස්තාරකරණය සඳහා බටහිර ඩ්‍රම්කිට් ප්‍රස්තාරකරණයේ ආභාසය | **37** |
| **Kalubowila, K. A. N.** | ටැම් එන් ජෙම් (Tam N Djem) නව අවනද්ධ වාද්‍යයෙහි බහු අංගික නාද උත්පාදනය : ශ්‍රී ලාංකේය ව්‍යවහාරික සංගීතයෙහි උපයෝගිතාව | **104** |
| **Kalupahana, K. M. P. A.** | කැලණි විහාරයෙහි ඇති සෝලියස් මැන්දිස් චිත්‍ර ශිල්පියාගේ සිතුවම්වල කාන්තා රුව භාවිතය පිළිබද අධ්‍යයනය. | **63** |

| | | |
|---|---|---|
| **Karunanayake, P. M.** | Comparative Study Between the Style of Playing the Esraj in Sri Lanka | **25** |
| | New Techniques of Finger Placement on Esraj in the Aspect of Producing Musical Notes | **107** |
| **Karunarathna, M. R. M.** | Effectiveness of music therapy on the physical and mental development of children with special needs | **99-100** |
| **Kumara, A. R.** | නිර්මාණාත්මක නර්තන කලාව සඳහා ආලෝක තටාක නිර්මාණකරණය | **47** |
| **Kumarathunga, K. M. S.** | Background and Originated periods of Folk Dance in Sri Lanka | **105** |
| **Kuruppu, V. K. A. C. R.** | අප්‍රිකානු අවනද්ධ භාණ්ඩ හා බැඳි ජන ඇදහිලි හා විශ්වාස | **38** |
| **Loshani, W. M. S.** | ජන සංගීතයෙන් පිළිබිඹු වන ලාංකේය සංස්කෘතිය (ප්‍රේමය හා ලිංගිකත්වය ඇසුරින්) | **58** |
| **Madapatha, P. M. & Perera, P. P.** | A Study on How Relaxed Technical Approaches Affect Perceived Tension and Performance in Pianists | **54** |
| **Madumini, D. W. M.** | ජන සංගීත සම්ප්‍රදායෙන් ගිලිහෙන හේන් සැහැල්ල | **59** |
| **Maduranga, K. S.** | Notation writing system in the Field of Applied Music in Sri Lanka | **69** |
| **Manyu, X.** | Materials, Tunings and Performances: A Survey of Chinese Bowed Zithers in the 21st Century | **79** |
| **Maushani, U. W. A. S.** | උත්තර භාරතීය රාගධාරී සංගීත විෂයයීය සංයුක්ත සහ වියුක්ත සංකල්ප සාධනය (ඕසබල් සහ බෲනර් විසින් ඉදිරිපත් කරන ලද “එලදායී ඉගෙනුම්” දැක්ම ඇසුරින්) | **76** |

| | | |
|---|---|---|
| **Munasinghe, W.** | ජනශ්‍රැතියෙන් පිළිබිඹු වන ශ්‍රී ලාංකේය ස්ත්‍රීත්වය (ජනකවි ඇසුරිනි) | **112** |
| **Nipunika, P. G. R. S.** | Online Music Learning in Higher Education in Sri Lanka: Challenges and Constraints | **29** |
| **Palitha, G. A. C. S.** | පාරම්පරික දැනුම; ග්‍රහ විමාන සඳහා යොදාගැනෙන ඉඹුල් ශාකය පිළිබඳ ජනශ්‍රැතිවේදී අධ්‍යයනයක් | **111** |
| **Panapitiya, S.** | සිංහල නැළවිලි කවියේ අනන්‍යතා ලක්ෂණ | **87** |
| **Pathirana, D. M.** | තන්ත්‍රී වාද්‍යයන්හි තන්ත්‍ර නාමකරණයː වයලීනයේ තන්ත්‍ර නාමකරණය සඳහා කුමාරතුංග මුනිදාසගේ ප්‍රවේශය පිළිබඳ අධ්‍යයනයක් සහ ඒ ඇසුරින් කැරෙන නව හඳුන්වා දීමක් | **40** |
| **Perera, W. M. M. V.** | A Study on practicing western music instruments among teens (With special reference to 12yrs to 18yrs) | **41** |
| **Peiris, D. C.** | භාරතීය සංගීතයේ භාවිත මාත්‍රාවේ අද්‍යතන ස්වරූපය | **102-103** |
| **Punchi Banda, W. M. R. K.** | ස්වයං නිර්මිත සංගීත භාණ්ඩː ශ්‍රී ලාංකේය ථුංපට බෙරය පිළිබඳ අධ්‍යයනයක් | **39** |
| **Pushpakumara, J. J.** | උඩරට බෙර වාදන සම්ප්‍රදාය තුළ දක්නට ලැබෙන යුගල අලංකාර බෙර වාදනයෙහි විශේෂතා (මූලික බෙර සරඹයක් ඇසුරෙනි) | **48** |
| **Prabashana, J. A. U.** | ලාංකේය හොරණෑවේ ස්වර අන්තරයන් සහ සමාන්තර ස්වර විභේද ග්‍රාමයේ ස්වර අන්තරයන් පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්. | **25** |
| | කෘතිම බුද්ධිය භාවිතයෙන් මිනිස් මුහුණේ ඉරියව් සඳහා සංවේදී සංගීත ප්‍රතිචාර ක්‍රියාවලියක් නිර්මාණය කිරීම | **73** |

| | | |
|---|---|---|
| **Rashapaksha, M.** | වෘත්තගන්ධි ප්‍රබන්ධ ආකෘතියෙහි අප්‍රකට විරිත් ලක්ෂණ (ශාන්තිකර්ම සාහිත්‍යය ඇසුරින්) | **109** |
| **Ranasinghe, C.** | සුනිල් සාන්ත සහ හෙළ හවුල අතර සබැඳියාව පිළිබඳ අධ්‍යයනයක් | **91** |
| **Ranasinghe, R. M. C. S.** | Bulletproof Boy Scouts (BTS) as a Part of South Korea’s Cultural Diplomacy and Soft Power Strategy | **95** |
| **Ranawaka, R. A. V. S.** | MIDI (Musical Instrument Digital Interface) තාක්ෂණය මගින් සංගීත භාණ්ඩ වාදනය කිරීමේ ඇති ඵලදායිතාව පිළිබඳ අධ්‍යයනයක් | **66** |
| **Randunuge, H. M.** | අවනද්ධාක්ෂරවල මහප්‍රාණ භාවිතය | **56** |
| **Salgamuwa, W.** | Nata Sankirtana: a cultural heritage of Manipur State- India | **88** |
| **Sandaruwan, T. W. G. D.** | නර්තනය, තාක්ෂණය සහ අන්තර්ජාල රැකියා අවස්ථා | **46** |
| **Sangeetha, R.** | ඇතැම් ශ්‍රී ලාංකේය සිංහල සරල ගීත ශාස්ත්‍රීය ගීත ලෙස හැඳින්වීම පිළිබඳව විමර්ශනයක් | **115** |
| **Sanjeewa, K. M. M.** | Music activities among the Sri Lankan Moors of *Ampara* District | **98** |
| **Samarasinghe, K.** | In search of distinctive Sri Lankan music: Cyril de Silva Kulatillake | **94** |
| **Samarathunga, S. R.** | මුද්‍රිත ප්‍රකාශන සඳහා සිංහල භාෂාවෙන් සංගීත ස්වර ප්‍රස්තාර පිරියෙසුමෙහිලා මතුවන ගැටලු | **70** |
| **Samarawickrama, R.** | සෞන්දර්ය කලා විෂයධාරා මාර්ගගත ක්‍රමයට සිදු කිරීමේ දී සිසුන් මුහුණපාන ගැටලු පිළිබඳ අධ්‍යයනයක් | **110** |

| | | |
|---|---|---|
| **Senevirathne, R. P. M.** | ගාන සමය සංකල්පයට නව ප්‍රවේශයක් | **53** |
| **Sewwandi, H. G. M.** | ශ්‍රී ලාංකේය ජන ක්‍රීඩාවන්හි අන්තර්ගත ගායන ශෛලි පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් | **60** |
| **Sinclair, N.** | Effects of Voice Training on Oratory Skills | **31** |
| **Subhash, G. K. & Kumarasiri, M. A. K. P.** | හින්දුස්තානී රාගධාරී ස්වර ප්‍රස්තාර යතුරු ලියනය කිරීමේ දී විද්‍යාර්ථීන් විසින් මුහුණ දෙනු ලබන අභියෝග සඳහා ප්‍රතිකර්ම වශයෙන් පරිගණක මෘදුකාංගයක් සංවර්ධනය | 65 |
| **Shanaz, S. S. F.** | මනිරත්නම් විසින් අධ්‍යක්ෂණය කරන ලද බොම්බේ චිත්‍රපටයේ ගීත හා සංගීතය මගින් සන්නිවේදනය කෙරෙන හින්දු මුස්ලිම් අන්තර් ආගමික ගැටුම | 90 |
| **Thilakarathne, R. N.** | Visual tradition in dance and rituals on rock paintings and engravings | 97 |
| **Upamali, I.** | ප්‍රේමසිරි කේමදාස විසින් නිර්මාණය කළ ඔපෙරාවන්හි කටහඬ නිෂ්පත්තිය පිළිබඳ විමර්ශනයක් | **89** |
| **Uppalawanna, M. D. S.** | ප්‍රාග් ඓතිහාසික යුගයේ ශෛල පෘෂ්ඨීය පාදක කලාව තුළ හස්ති රූප භාවිතය. | **62** |
| **Weerasooriya, R. M. P. S. & Piyumali, D. M. S.** | ගැටබරු රජමහා විහාරයේ හේවිසි වාදනයෙහි සුවිශේෂීතාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් | **43** |
| **Wickramasinghe, J. L. T. U. & Ranasinghe, R. S.** | ප්‍රාථමික අධ්‍යාපනයෙහි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා සංගීතමය භාවිතාව | **30** |
| **Wickramasinghe, M.** | සරච්චන්ද්‍ර නාට්‍ය සංගීත භාවිතාව | **52** |
| **Wimaladarma, U. I. U.** | කතලුව ගිනිවැල්ල පුරාණ විහාරයේ මතභේදාත්මක සිතුවම්කරණය පිළිබඳ අධ්‍යයනයක් | **61** |
| **Wimalasena, K. G. N. D.** | බටහිර බෙංගාලයේ 'බාවුල් ' ජන සම්ප්‍රදාය කෙරෙහි තන්ත්‍රයානික බුදු දහමේ බලපෑම පිළිබඳ අධ්‍යයනයක්. | **82** |

| | | |
|---|---|---|
| **Wimalasiri, I. D. S. D** | ශ්‍රී ලංකාවේ පවතින උද්ධමනය සහ ආනයනික සීමා සංගීත අධ්‍යාපනයට ඇති කරන බලපෑම. (විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් ඇසුරින් කෙරෙන විමර්ශනයක්) | **33** |
| **Wimalasiri, M.** | කොහොඹා කංකාරියේ රංග ප්‍රවර්ග | **44-45** |
| **Yatiwella, Y. K. U. B. & Weerakkody, I. S.** | සිරි සුමංගල විද්‍යායතන පිරිවෙනෙහි පෙරදිග සංගීත ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ ගුණාත්මක අධ්‍යයනයක් | **85** |
| **Zhi, L.** | Song Research Methods in China | **80** |

# Abstracts

# Session 01

| ID | Topic | Author |
|---|---|---|
| **MU/IRS/A/05** | ක්‍රිස්තු වර්ෂ 1232-1815 අතර කාලපරිච්ඡේදයේ දී ශ්‍රී ලංකාවේ ව්‍යාප්තව පැවති තන්ත්‍රීය වාද්‍ය භාණ්ඩ (Stick zithers/ Tube zithers) | ඉසුරු බී. දෙහිදෙණිය |
| **MU/IRS/A/46** | Comparative Study Between the Style of Playing the Esraj in Sri Lanka | Pamalka Manjitha Karunanyake |
| **MU/IRS/A/07** | ලාංකේය හොරණෑවේ ස්වර අන්තරයන් සහ සමාන්තර ස්වර විභේද ග්‍රාමයේ ස්වර අන්තරයන් පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්. | ජේ.ඒ.යු. ප්‍රභාෂණ |
| **MU/IRS/A/04** | ගෙස්ටෝල්ට්වාදයට අනුව සංගීත පෙලඹවීම මිනිස් මනසේ ක්‍රියාකාරිත්වය කෙරෙහි බලපාන ආකාරය | ඒ. සමීර කසුන් චන්ද්‍රසිරි |

# ක්‍රිස්තු වර්ෂ 1232-1815 අතර කාලපරිච්ඡේදයේ දී ශ්‍රී ලංකාවේ ව්‍යාප්තව පැවති තන්ත්‍රීය වාද්‍ය භාණ්ඩ (Stick zithers/ Tube zithers)

**ඉසුරු බී. දෙහිදෙණිය**[1]

ශාකමය තන්තු, ලෝහ, සත්ව බඩවැල්, පටනූල් ආදි ද්‍රව්‍යවලින් නිර්මාණය කළ තතක් එකිනෙකට විරුද්ධ දිශාවට ඇද පෙළීමට ලක් කර, හඬ නිපදවන ඕනෑම සංගීත වාද්‍යයක් තත් භාණ්ඩයක් ලෙස හැඳින්විය හැකිය. *Stick zither/ Tube zither* තත් භාණ්ඩ යනු දණ්ඩක් හෝ ඇතුළත කුහරමය අවකාශයක් සහිත නාළයක් ප්‍රධාන අනුනාදකය (Resonator) ලෙස භාවිත කරන තත් භාණ්ඩ විශේෂයකි. මෙම තත් භාණ්ඩ ක්‍රි. ව. 6 වන සියවසයේ සිට ඉන්දියානු සාගරයේ පිහිටා තිබෙන ඉන්දියාව, ශ්‍රී ලංකාව සහ නැගෙනහිර මුහුදු සීමාවේ පිහිටා තිබෙන අග්නිදිග ආසියාව දක්වා ව්‍යාප්තව ඇත. ක්‍රි. ව. 1232-1815 අතර කාලපරිච්ඡේදයේ දී ශ්‍රී ලංකාවේ ව්‍යාප්තව පැවති *Stick zither* තන්ත්‍රීය වාද්‍ය භාණ්ඩ සමකාලීන භාරතයේ හා අග්නිදිග ආසියාවේ ව්‍යාප්තව පැවති *Stick zither* භාණ්ඩ සමඟ දක්වන කලාපීය හා කාලානුරූපීය සමාන අසමානතා මොනවා ද යන අපැහැදිලි තත්ත්වය විසඳාලීම පර්යේෂණ ගැටලුව වේ. මෙම පර්යේෂණය ගුණාත්මක ක්‍රමවේදය අනුව සිදු කරන පර්යේෂණයකි. ඒ සඳහා ප්‍රාථමික මූලාශ්‍රය යටතේ කැටයම් සහ සිතුවම් යොදාගෙන ඇති අතර, ද්විතීයික මූලාශ්‍රය යටතේ පොත්, පර්යේෂණ ලිපි යොදාගෙන ඇත. ක්‍රිෂ්ණස්වාමී යෝජනා කරන ආකාරයට ඓතිහාසික සංගීත භාණ්ඩවල ස්වරූපය සහ අභිධාන (Names) පිළිබඳව තොරතුරු අනාවරණය කරගැනීමට පුරාවිද්‍යාත්මක සාධක, ඓතිහාසික සිතුවම් හා කැටයම්, ඓතිහාසික ලේඛන, ගෝත්‍ර හා ජන කණ්ඩායම්වලට අයත් සංගීත භාණ්ඩ එකිනෙකට සම්බන්ධ කර විශ්ලේෂණය කළ යුතු ය. මෙම පර්යේෂණයේ දී එම ප්‍රවේශයෙන් මූලාශ්‍රය විශ්ලේෂණය කිරීම සිදු වේ. ක්‍රි. ව. 9-13 අතර කාලයේ දී භාරතයේ ද ක්‍රි. ව. 12 වන සියවසයෙන් පසු අග්නිදිග ආසියාවේ ද සුසර යතුරු, අමතර පේධිකා, පර්දා පුවරු ආදි නව අංග *Stick zither* තත් භාණ්ඩවලට එකතුවීම ආරම්භ වී තිබේ. මීට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ ක්‍රි. ව. 17-18 සියවස් අතර කාලයේ දී සුසර යතුරු එකතුකර තිබෙන අතර, ක්‍රි. ව. 18 වන සියවසේ දී සම්පූර්ණ ගෝලාකාර පේධිකා දෙකක් සහිත *Stick zither/ Tube zither* තත් භාණ්ඩ පිළිබඳව ද තොරතුරු වාර්තා වේ. ශ්‍රී ලංකාවේ ක්‍රිස්තු වර්ෂ 1232-1815 අතර කාලපරාසයේ ව්‍යාප්තව පැවති *Stick zither* භාණ්ඩ සමකාලීන භාරතයේ හා අග්නිදිග ආසියාවේ ව්‍යාප්තව පැවති *Stick zither* තත් භාණ්ඩ සමඟ කලාපීය වශයෙන් පොදු සමානත්වයක් දක්වයි. නමුත් ශ්‍රී ලංකාවේ *Stick zither* තත් භාණ්ඩවල කාලානුරූපීයව ඇති වී තිබෙන ප්‍රවර්ධනය උක්ත ප්‍රදේශ දෙකට සාපේක්ෂව සංසන්දනය කිරීමේ දී සැලකිය යුතු මට්ටමකින් අසමාන බව පැහැදිලි වේ.

**මුඛ්‍ය පද**- *Stick zither, Tube zither,* දෘශ්‍ය කලා මූලාශ්‍රය, සංගීත භාණ්ඩ ව්‍යුහකරණය, සංගීත පරිණාමය

---

[1] බාහිර උපදේශක, සංගීතවිද්‍යා අධ්‍යයනාංශය, සංගීත පීඨය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
isurudehideniya96@gmail.com

# Comparative Study between the Styles of Playing the 'Esraj' in Sri Lanka

**Pamalka Manjitha Karunanayake**[1]

*Esraj* is a member of the Indian stringed instrument family, *Sarangi*. The development of the esraj has undergone many steps during the last two centuries. At present there are mainly four styles of playing the *esraj*; Traditional style, *Panjabi* style, *Delhi* style and *Bishnupur* style. The problem of the study was to find out whether there were any characteristics in separate playing styles which makes those styles of any speciality than the others. Main focus of this study was the contrast between the Traditional style and the *Bishnupur* style whereas these styles were the most used in Sri Lanka. This study gave the most neutral answer to the comparative questions among the above mentioned styles. In Sri Lanka, the styles of playing the *esraj* has been discussed, argued and in some occasions caused damage to the players. This study shows that the historical, developmental, performing, artistic and structural impact affected the style, as well as new trends of *esraj*. This study has done a qualitative research where, data were collected through interviews with professionals, literature studies, participatory observations and, tertiary resources. Research outcomes were presented through sketches and diagrams where necessary.

**Keywords**

Esraj, Playing Styles, Gharana, Discussion in Sri Lanka, Comparative Study.

[1] Department of North Indian Music, Faculty of Music, University of the Visual and Performing Arts
pamalkakarunanayake2@gmail.com

# ලාංකේය හොරණෑවේ ස්වර අන්තර සහ සමාන්තර ස්වර විභේද ග්‍රාමයේ ස්වර අන්තර පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්.

**ජේ. ඒ. යූ. ප්‍රභාෂණ**[1]

වර්තමාන භාවිතයට අනුව ලාංකේය සාම්ප්‍රදායික සංගීත ක්‍රියාවලිය තුළ භාවිත එකම ස්වර වාද්‍ය භාණ්ඩය එසේත් නැතිනම් ස්වරාන්තර වෙනස් කළ හැකි වාද්‍ය භාණ්ඩය ලෙස හොරණෑව දැක්විය හැකිය. මෙම පර්යේෂණය මගින් සිදු කරනු ලබනුයේ දේශීය හොරණෑව මඟින් ජනනය වන්නා වූ ස්වර ග්‍රාමයේ පවතින ස්වර අන්තර සහ වර්තමානයේ ලොව පිළිගත් ස්වර ග්‍රාමය වන සමාන්තර ස්වර ග්‍රාමය යොදාගෙන සිදු කරන්නා වූ තුලනාත්මක දෘෂ්ඨියෙන් යුතු අධ්‍යයනයකි. මෙම පර්යේෂණයේ මූලික අරමුණු ලෙස හොරණෑව මඟින් වාදනය කළ හැකි ස්වර ග්‍රාමය සමාන්තර ස්වර විභේද ග්‍රාමය හා යම් සබඳතාවක් පවතින්නේ ද යන්න අධ්‍යයනය කිරීම දැක්විය හැකිය. එමඟින් වර්තමාන ලාංකේය සංගීත නිර්මාණකරණ ක්‍රියාවලිය සඳහා සාම්ප්‍රදායික හොරණෑවේ භාවිතය සම්බන්ධයෙන් මතුවන ගැටලුකාරී තත්ත්ව මඟහරවා ගැනීමට හැකිවේ ද යන්න මෙහි පර්යේෂණ ගැටලුව ලෙස දැක්විය හැකිය. එනම් අද්‍යතන සංගීත නිර්මාණකරණය සඳහා පදනම වී ඇත්තේ සමාන්තර ස්වර විභේද ග්‍රාමය යි, එයත් සමඟ වෙනත් ආගන්තුක ස්වර ග්‍රාමයකට අනුව නිර්මාණය වී ඇති තාරතා අන්තර භාවිත කිරීම තරමක ගැටලුකාරී ස්වභාවයක් ගෙන තිබේ. පර්යේෂණයේ මූලික පියවර කිහිපයකි. මේ සඳහා හොරණෑ වාදන ශිල්පීන් හා හොරණෑ වර්ග තෝරාගැනීම මූලික ම කටයුත්තයි. මේ සඳහා වර්තමාන සම්මතයේ භාවිත වන සම්ප්‍රදායික හොරණෑ 10ක් මගින් නාද සාම්පල ලබාගැනීම සිදු විය. පසු ව එම සාම්පල වෙන් වෙන් වශයෙන් හා කණ්ඩායම් වශයෙන් ගෙන තනි තනි සාම්පලයට හා පොදුවේ සියලුම හොරණෑ වාදන සාම්පල සඳහා ස්වර අන්තර ගණනය කිරීම සිදු කරන ලදී. ඒ සඳහා විශ්ලේෂණ මෘදුකාංග ලෙස SPSS, Speech analyzer, Cubase 10.5 මෘදුකාංග භාවිත කරන ලදී. පසුව එලෙස ලබාගන්නා ලද හොරණෑවේ ස්වර අන්තර සමාන්තර ස්වර විභේද ග්‍රාමයේ සම්මත ස්වර අන්තර සමඟ සන්සන්දනය කරන ලදී. එලෙස සිදුකරනු ලැබූ තුලනාත්මක පර්යේෂණයේ ප්‍රතිඵල ලෙස සමාන්තර ස්වර විභේද ග්‍රාමයේ හා හොරණෑව ආශ්‍රිතව භාවිත වන ස්වර ග්‍රාමයේ ස්වර අන්තර ඍජුව ම සමාන නොවන බව අනාවරණය විය. එහෙත් හොරණෑව ආශ්‍රිත ස්වර ග්‍රාමයේ පාදක තාරතාවය වෙනස් කිරීම මගින් මෙම ස්වර ග්‍රාම දෙකෙහි ස්වර අන්තර තුළ 70% ත් 75%ත් අතර ප්‍රමාණයක ඒකමිතික භාවයක් නිර්මාණය කරගත හැකිය. සංගීත නිර්මාණකරණයේ දී එලෙස පාදක තාරතාව වෙනස් කිරීමෙන් හොරණෑව සාධනීය ලෙස භාවිත කිරීමේ හැකියාව පවතී. පර්යේෂණ දත්ත හා ප්‍රතිඵල මත පදනම් ව හොරණෑව ආශ්‍රිත ස්වර ග්‍රාමයට අදාළව නිර්මාණ සංගීතයට භාවිත කළ හැකි අයුරින් සකස් කරන ලද අද්‍යෘශ්‍ය සංගීත යෙදවුමක් නිර්මාණය කිරීම ද මෙහිදී සිදු විය.

**ප්‍රමුඛ පද** - ස්වරග්‍රාම, හොරණෑව, ජන සංගීතය, නාද තාක්ෂණය, තුලනාත්මක සංගීතවේදය.

[1] තාවකාලික කථිකාචාර්ය, සංගීතවිද්‍යා අධ්‍යයනාංශය, සංගීත පීඨය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
uprabhashana@gmail.com

# ගෙස්ටෝල්ට්වාදයට අනුව සංගීත පෙලඹවීම මිනිස් මනසේ ක්‍රියාකාරිත්වය කෙරෙහි බලපාන ආකාරය

**ඒ. සමීර කසුන් චන්ද්‍රසිරි** [1]

සන්නිවේදනයෙහි එක් කාර්යයක් ලෙස පෙලඹවීම පෙන්වා දිය හැකිය. මෙහි පෙලඹීමේ මාධ්‍ය ලෙස සංගීතය යොදාගැනෙයි. මේ අනුව සංගීත පෙලඹවීම තුළ ගෙස්ටෝල්ට්වාදයට අනුව මිනිස් මනසේ ක්‍රියාකාරිත්වය මෙහි මාතෘකාවයි. ගෙස්ටෝල්ට්වාදයට අනුව මිනිස් මනසේ ක්‍රියාකාරිත්වයට සංගීත පෙලඹවීමක් තුළින් බලපෑමක් කළ හැකි ද යන්න මෙහි දී අධ්‍යයනය කෙරේ. නිර්මාණය කරගත් සංගීත ඛණ්ඩයක් ආශ්‍රයෙන් සමාජ මාධ්‍ය තුළ වයස අවුරුදු 25ත් 50ත් අතර අහඹු නියැදියකට ප්‍රශ්න මාලාව සහ සංගීත ඛණ්ඩ යොමු කිරීම මඟින් තොරතුරු එක්රැස් කර ගනු ලැබිණි. පර්යේෂණයේ උපන්‍යාස වූයේ මිනිස් මනස තුළ ක්‍රියාකාරීත්වයට සංගීතය මගින් පෙලඹවීම් ඇති කළ හැකි බව ය. එසේ සිදු ඇති වන පෙලඹවීම් පුද්ගලානුබද්ධවීම හා පුද්ගලයා තුළ පවතින සංගීත ඥානය අනුව ග්‍රහණය කරගන්නා ආකාරයේ විෂමතාවක් ඇති දැ යි හඳුනාගැනීම හා ගෙස්ටෝල්ට්වාදයට අනුව මිනිස් මනසේ ක්‍රියාකාරිත්වයට සංගීතය මගින් ඇති කරන පෙලඹවීම බලපාන ආකාරය හඳුනාගැනීම මෙහි මූලික අරමුණ වේ. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ ද සාහිත්‍ය මූලාශ්‍රය, මානව මූලාශ්‍රය, සම්මුඛ සාකච්ඡා, ශ්‍රව්‍ය ආධාරක, සායනික පර්යේෂණ මඟින් දත්ත ලබා ගන්නා ලදී. සංගීතය මිනිස් මනස වඩාත් යහපත් තැනකට පත් කිරීමට සංගීතය මගින් පෙලඹවීම් ඇති කරන බව නිගමනය කළ හැකිය.

.

**ප්‍රමුඛ පද** - මනස, පෙලඹවීම, චිකිත්සාව, මනෝවිද්‍යාව, සංගීතවේදය

[1] කර්ණාටක අධ්‍යයනාංශය, සංගීත පීඨය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය sameerakasun1996@gmail.com

# Session 02

| ID | Topic | Author |
| --- | --- | --- |
| **MU/IRS/02** | Online Music Learning in Higher Education in Sri Lanka: Challenges and Constraints | P.G.R. Shehani Nipunika |
| **MU/IRS/10** | ප්‍රාථමික අධ්‍යාපනයෙහි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා සංගීතමය භාවිතාව | ජේ. එල්. ටී. යූ. වික්‍රමසිංහ, ආර්. එස්. රණසිංහ |
| **MU/IRS/13** | Efects of Voice Training on Oratory Skills | Nethma Sinclair |
| **MU/IRS/05** | ගායන රියැලිටි කලාව තුළින් බිහිවන ශිල්පීන්ගේ සංගීතමය අනාගතය පිළිබඳ අධ්‍යයනයක් | පී. ඉෂාදි දුලක්ෂණ |
| **MU/IRS/11** | ශ්‍රී ලංකාවේ පවතින උද්ධමනය සහ ආනයනික සීමා සංගීත අධ්‍යාපනයට ඇති කරන බලපෑම. (විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් ඇසුරින් කෙරෙන විමර්ශනයක්) | අයි. ඩී. සකුනි දිල්හාරා විමලසිරි |
| **MU/IRS/20** | Behavior of music in international relations; A musical approach for peace and conflict resolutions | Sandali Yapa Abeywardana |

# Online Music Learning in Higher Education in Sri Lanka: Challenges and Constraints

**P.G.R. Shehani Nipunika** [1]

Online music learning is one of the learning trends in the world due to recent past incidents. As a result of it, higher education regarding music in Sri Lanka also adopted online music learning. However, challenges and constraints arose in online music learning among higher-education students. This study focused on those difficulties faced by students in the faculty of music at the University of the Visual and Performing Arts, Colombo 07. A qualitative case study was used as a methodology. An online closed-ended questionnaire was randomly distributed among a sample of 50 students in the 3rd year of the academic year 2019/2020 at the Faculty of Music at UVPA. After analyzing, it was noticed that 70% of the participants encountered challenges with technical issues. In addition, most participants stated that they encountered difficulties due to a lack of interconnection between the student and the lecturer. Furthermore, participants illustrated that there was no motivation to listen to the lesson due to isolation. Participants also described challenges while playing the musical instruments virtually. Moreover, 92%, 70%, and 26% of students were confronted with constraints with power interruptions, poor internet connection and signal delays, and limitations of electronic devices, respectively. In addition, 46% of students experienced unequal distribution of speed internet connection, 18% stated that they had to buy a musical instrument to learn music online, and 10% stated that they borrowed musical instruments from friends. Results revealed that although participants faced many problems, they overcame these. Therefore, if authorities wish to implement online music learning platforms in higher education further in the future, minimizing these challenges and constraints is suggested to give better online music learning for students.

**Keywords**: Challenges, Constraints, Higher Education, Online Music Learning, Sri Lanka

---

[1] Department of Western Music, Faculty of Music, University of Visual and Performing Arts.
*shaniparapitiya81@gmail.com*

# ප්‍රාථමික අධ්‍යාපනයෙහි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා සංගීතමය භාවිතාව

**ජේ. එල්. ටී. යූ. වික්‍රමසිංහ, ආර්. එස්. රණසිංහ**[1]

ප්‍රාථමික අධ්‍යාපනය සාමාන්‍යයෙන් සිසුන්ට කියවීම, ලිවීම සහ ගණිතය පිළිබඳ මූලික කුසලතා ලබා දීම සඳහා නිර්මාණය කර ඇති ඉගෙනුම් සහ අධ්‍යාපනික ක්‍රියාකාරකම් සපයන අතර, ද්විතීයික අධ්‍යාපනය සඳහා සූදානම් වන දැනුමේ සහ පුද්ගලික සංවර්ධනයේ මූලික ක්ෂේත්‍ර ඉගෙනීම සහ අවබෝධ කරගැනීම සඳහා ශක්තිමත් පදනමක් ස්ථාපිත කරයි. ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය තුළ එක ශ්‍රේණියේ සිට පහ ශ්‍රේණිය දක්වා වූ කාල පරිච්ඡේදය ප්‍රාථමික අධ්‍යාපන සමය ලෙස හැඳින්වේ. විධිමත් අධ්‍යාපනය තුළ ප්‍රාථමික අධ්‍යාපනය ලබන මුල් වසර පහ දරුවාගේ තීරණාත්මක ඉගෙනුම් අවධියකි. ''හොඳ සංගීතය තරම් ළදරු වියේ සිට වැඩිහිටි විය දක්වා ජනතාවගේ භාව පෝෂණය කරන තවත් බලවේගයක් නොමැත'' යන අනුව සංගීතය දරුවාගේ පෞරුෂ වර්ධනයට, නිර්මාණාත්මක ශක්‍යතා හා බුද්ධි වර්ධනයට ප්‍රාමාණික දායකත්වයක් ලබා දෙන බව පැහැදිලි ය. ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපනයෙහි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ සංගීතමය භාවිතය තුළ විධිමත් ක්‍රමවේදයක් පවතින්නේ ද යන්න මෙම පර්යේෂණයෙහි ගැටලුව යි. ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපනයෙහි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා සංගීතය භාවිත කිරීමේ විධිමත් ක්‍රමවේද වන්නේ ද? යන්න හඳුනාගැනීමත්, එහි දී සංගීත භාණ්ඩ භාවිතය පිළිබඳ ව අධ්‍යයනය කිරීම හා නිශ්චිත වශයෙන් වෙන්කොට ඇති කාල සීමාවක් පවතින්නේ ද? යන්න හඳුනාගැනීම මෙම පර්යේෂණයෙහි අරමුණු ලෙස දැක්විය හැකි ය. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ ද්විතීයික දත්ත ලෙස පොත්පත්, සඟරා, ලිපි ලේඛන, සම්මුඛ සාකච්ඡා හා ප්‍රශ්නාවලි හරහා දත්ත එක්රැස් කරන ලදී. මෙහි නියැදිය ලෙස ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක පහළොවකින් අහඹු ලෙස තෝරා ගත් සිංහල මාධ්‍ය පාසැල් පහළොවක ගුරුවරුන් පහළොස් දෙනෙකු යොදාගන්නා ලදී. එහි දී ලබා ගත් තොරතුරු අනුව ප්‍රාථමික අධ්‍යාපන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ සංගීතය ආශ්‍රිත ක්‍රියාකාරකම් සිදු කළ ද ඒවා නිසි ක්‍රමවේදයකට අනුකූල ව සිදු නො වන බවත්, මේ සඳහා සංගීත ගුරුවරයාගේ ප්‍රාමාණික මැදිහත්වීමක් සිදු නො වන බවත් දක්නට ලැබිණි. නමුත් බොහෝ පාසැල්වල ආදේශ සංගීත භාණ්ඩ නිෂ්පාදනය හා භාවිතය කෙරෙහි දරුවන් යොමු කර ඇති අතර, දරුවන්ගේ සංජානන හා රිද්මීය කුසලතා වර්ධනය කෙරෙහි උපකාරී වේ. විෂය නිර්දේශයානුකූල අනෙකුත් ප්‍රාථමික විෂයයන් සඳහා සංගීතය උපයෝගී කොටගත හැකි බවත් එමගින් දරුවාගේ බුද්ධි වර්ධනය, නිර්මාණාත්මක කුසලතා වර්ධනය, පෞරුෂත්ව වර්ධනය, මානසික සමතුලිතතාව පවත්වා ගැනීම හා මතක ශක්තිය වර්ධනය සඳහා ඍජුව දායක කර ගත හැකි වේ. මේ අනුව ප්‍රාථමික දරුවන්ට නිවැරදි නාද මාලා ග්‍රහණය කරගැනීම සඳහා අවශ්‍ය අවස්ථාවල දී විෂය සමගාමී ක්‍රියාකාරකම්හි යෙදවීමට සංගීත ගුරුවරයාගේ ප්‍රාමාණික මැදිහත්වීමක් අවශ්‍ය වන බව නිගමනය කළ හැකි ය.

**ප්‍රමුඛ පද** - ප්‍රාථමික අධ්‍යාපනය, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය, සංගීත භාවිතාව

[1] සංගීතවිද්‍යා අධ්‍යයනාංශය, සංගීත පීඨය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

# Effects of Voice Training on Oratory Skills

**Nethma Sinclair**[1]

Studies depict children who tune in to music frequently illustrate vast improvement than those who do not. Music was presented to the children's environment as a tactile foundation for standard educational programs. The voice is considered as the most expensive as well as the cheapest instrument of all which is very much linked to oratory skills. The purpose of this experimental study was to examine the effects of voice training on the oratory skills of eleven to sixteen-year-olds. With regard to this, the analysis was aided through in depth and semi structured interviews, questionnaires and aptitude tests which may be supported by tape and video recordings if allowed. Similar work has been conducted in an international context wherein, the proposed study may contribute a new understanding to the society in general and specifically for Sri Lankans and future researchers.

**Key words:** oratory skills, voice training, vocals

[1] Department of Western Music, Faculty of Music, University of the Visual and Performing Arts, nethmasinclair2021@gmail.com

# ගායන රියැලිටි කලාව තුළින් බිහිවන ශිල්පීන්ගේ සංගීතමය අනාගතය පිළිබඳ අධ්‍යයනයක්

**පී. ඉෂාදි දුලක්ෂණ**[1]

රියැලිටි කලාව අද වන විට ලොව පුරා ප්‍රචලිතව පවත්නා සංගීත කලාවේ ප්‍රවණතාවකි. තවත් ආකාරයකින් රූපවාහිනී මාධ්‍යය එහි හැඩය පවත්වා ගනු වස් නිර්මාණය කළ එක්තරා ආකාරයක නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමකි. මෙය නිෂ්පාදකයන් විසින් නිර්මාණය කර ගනු ලබන පරිසරයක් තුළ තරඟකරුවන්ගේ හා තරඟකාරිනියන්ගේ හැසිරීම මත පාලනය වන වැඩසටහන් විශේෂයකි. ලාංකේය ගායන රියැලිටි කලාව තුළින් බිහිවන ගායක ගායිකාවන්ගේ වෘත්තීයමය සංගීත ක්ෂේත්‍රයෙහි අනාගතය පිළිබඳ ව අධ්‍යයනයක් සිදු කිරීම මෙහි මුඛ්‍ය පරමාර්ථය වේ. ගායන රියැලිටි තරග තුළින් බිහි වන්නා වූ ගායන ශිල්පීන් තවදුරටත් වෘත්තීයමය ගායකයෙකු හෝ ගායිකාවක ලෙස සංගීත ක්ෂේත්‍රයෙහි රැඳී සිටී ද යන්න මෙම පර්යේෂණ ප්‍රපංචය තුළින් පර්යේෂණ ගැටලුවක් ලෙස ගෙන විවරණාත්මක හා විශ්ලේෂණාත්මක අධ්‍යයන ප්‍රවේශය යටතේ පර්යේෂණය සිදු කෙරිණි. මෙම පර්යේෂණය සඳහා වර්තමානයේ විකාශනය වෙමින් පවතින සිරස නාලිකාවෙහි THE VOICE SRI LANKA සහ දෙරණ නාලිකාවෙහි DREAM STAR වැඩසටහන් පර්යේෂණ නියැදි ලෙස යොදාගැනෙයි. එහිදී ප්‍රාථමික හා ද්විතීය මූලාශ්‍රය දත්ත එක් රැස් කිරීමට උපකාරී කර ගැනිණි. රියැලිටි තරග හා සම්බන්ධ වාර්තා හා පොත් පත් අධ්‍යයනය මගින් ද්විතීයික දත්ත ගොඩනගා ගන්නා අතර, තරඟ විනිසුරුවන් තිදෙනෙක්, ඉදිරිපත් වූ තරඟකරුවන් විසිදෙනෙකු, සමාජ මාධ්‍ය ඇසුරින් නිස්සම්භාවී නියැදීමේ ක්‍රමය යටතේ තෝරාගන්නා ලද රියැලිටිලෝලී ප්‍රේක්ෂකයන් දසදෙනෙකු, තරඟ නිෂ්පාදකවරුන් දෙදෙනෙක් හා ලාංකේය සංගීත ක්ෂේත්‍රයෙහි වෘත්තීයමය ගායක ගායිකාවන් පස්දෙනෙකු තොරතුරු රැස්කිරීමේ සහභාගි පාර්ශ්වයන් ලෙස යොදා ගැනිණ. මෙහිදී දත්ත රැස් කිරීම සඳහා සම්මුඛ සාකච්ඡා හා ප්‍රශ්නාවලි ද යොදා ගැනිණි. තරඟාවලිය පැවැත්වෙන්නා වූ කාල පරාසය තුළ දී ඔවුන් ඉතාමත් උද්වේගකර මට්ටමකින් සංගීත ක්ෂේත්‍රය තුළ කැපී පෙනුණ ද තරඟාවලියේ අවසානය සමඟ දීර්ඝ කාලයක් එලෙස වෘත්තීය සංගීත ක්ෂේත්‍රය තුළ රැඳීමක් දක්නට නොලැබීම මෙම පර්යේෂණයේ දී ඉස්මතු වේ. මෙම අධ්‍යයනයේ දී ඔවුන්ගේ නව නිර්මාණ, සමාජ පිළිගැනීම හා පුද්ගල පෞරුෂත්වය මෙන් ම සමාජ මාධ්‍ය භාවිතය ආදි හේතූන් ඒ සඳහා බලපාන බව ගම්‍යමාන වූවකි.

**මූල පද** - සංගීත ක්ෂේත්‍රය, ලාංකේය ගායන රියලිටි කලාව, සමාජ මාධ්‍යය, ජනප්‍රිය සංස්කෘතිය

---

[1] සංගීතවිද්‍යා අධ්‍යයනාංශය, සංගීත පීඨය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
pabotuwa.dulakshana@gmail.com

# ශ්‍රී ලංකාවේ පවතින උද්ධමනය සහ ආනයනික සීමා සංගීත අධ්‍යාපනයට ඇති කරන බලපෑම.

(විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් ඇසුරින් කෙරෙන විමර්ශනයක්)

**අයි. ඩී. සකුනි දිල්හාරා විමලසිරි** [1]

දේශපාලනික අර්බුද මත ශ්‍රී ලංකාව තුළ උද්ගත වූ උද්ධමනකාරී වාතාවරණය මත විනිමය කළමනාකරණය සඳහා අවස්ථා කිහිපයක දී ආනයන සීමා පනවන ලදී. එම ආනයන භාණ්ඩ අතරට සංගීත භාණ්ඩ ද ඇතුළත් විය. ඉන් ආසන්නත ම අවස්ථාව ලෙස දෙදහස් විසිදෙක වර්ෂයේ සැප්තැම්බර් මස විසිතුන් වන දින සිට ආනයනය තාවකාලිකව අත්හිට වූ භාණ්ඩ අතරට සංගීත භාණ්ඩ ද අයත් විය. ඉහත සඳහන් කළා වූ අවස්ථා මත මාස ගණනාවක සිට අවශ්‍යතාවට සාපේක්ෂව සීමිත හා මිල අධික ලෙස ඉහළ යාම තුළ සැබැවින්ම සංගීත අධ්‍යයනය කෙරෙහි ඇතිකළ බලපෑම පිළිබඳ වූ ගැටලුව විශ්ලේෂණාත්මකව අධ්‍යයනය කිරීම සිදු විය. පර්යේෂණයේ අරමුණ වන්නේ ඉහත කී හේතු මත සංගීතයේ ප්‍රායෝගික අධ්‍යයනයට අවශ්‍ය භාණ්ඩ හා අතිරේක අලුත්වැඩියා කොටස්වල හිඟතාව සහ අධික මිල හේතුවෙන් සිය අධ්‍යයන කටයුතුවලට ඇති කළ සෘණාත්මක බලපෑම හා ඒ පිළිබඳව වගකිවයුතු පාර්ශ්ව වෙත දැනුවත් කිරීමේ අවශ්‍යතාව මෙන්ම විද්‍යාර්ථීන් මුහුණ දෙන මෙම අර්බුදකාරී තත්ත්වය අනාවරණය කරලීම ය. ඒ සඳහා සංගීතය විෂයක් ලෙස අධ්‍යයනය කරනු ලබන උපාධි අපේක්ෂකයින් පස් දෙනෙකු සහ උපාධි අපේක්ෂිකාවන් දහදෙනෙකුගෙන් යුත් නියැදියක් උපයෝගි කරගැනිණ. එහිදී පොදු ප්‍රශ්නාවලියක් උපයෝගි කොට දත්ත විශ්ලේෂණය කිරීම සිදු විය. මෙහිදී නිගමන වශයෙන් සංගීත භාණ්ඩවල හිඟතාව හා ඩොලරයේ අගය ඉහළ යාම හේතුව කොට දක්වමින් කලු කඩ මිලක් නිර්මාණය වීම තුළින්, එය ස්ථිර ආදායමක් නොමැති සිය වැඩිහිටියන්ගෙන් යැපෙන සිසුන් තමන් සතුව නොමැති නමුත් අධ්‍යයනය කිරීමට කැමැත්තක් දක්වන සංගීත භාණ්ඩ අධ්‍යයනය කිරීමට යොමු වීමේ ප්‍රවණතාවේ අඩුවක් හෙළිදරව් විය. තව ද රටේ පැවැති අර්බුදකාරී තත්වය හමුවේ විශ්වවිද්‍යාල වසා දැමූ විට නිවසේ සිට අධ්‍යයන කටයුතු සිදු කිරීමට හා විභාගවලට මුහුණ දීමේ දී අසීරුතාවලට පත් වූ බව මෙහිදී අනාවරණය විය. සංගීත අධ්‍යාපනය කෙරෙහි අහිතකර වූ මෙවැනි බලපෑම්වලට හේතු සොයා බලා ඒවාට පාලන මිල ගණන් හඳුන්වාදීමේ නිශ්චිත යාන්ත්‍රණයක් ගොඩනැංවීම සඳහා අවශ්‍ය නෛතික ක්‍රියාමාර්ග ගැනීමට වගකිවයුත්තන්ගේ සාධනීය මැදිහත්වීම කාලීන අවශ්‍යතාවක් බව හඳුනාගන්නා ලදී.

**මුඛ්‍ය පද** : ආනයන සීමා, ශ්‍රී ලංකාව, සංගීත භාණ්ඩ, උද්ධමනය, සංගීත අධ්‍යාපනය.

[1] සංගීතවිද්‍යා අධ්‍යයනාංශය, සංගීත පීඨය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය dilharawimalasiri@gmail.com

# Behavior of music in International Relations; A musical approach for Peace and Conflict Resolutions

**Sandali Yapa Abeywardana**[1]

The purpose of this research is to understand how music influences international relations and to build peace and conflict resolutions. Music can capture a wide range of feelings, go to the essence of things, and speak to the soul. The power to brudge communities and to strengthen the concept of togetherness is imbued within it. Thus, music has the capacity to cross boundaries, build connections between those with disparate origins and conflicting ideologies. Utilizing music as a strategy in international relations can lead to improved intercultural understanding and global collaboration. This research is to address, "Can music build greater understanding between nations?" and "May music help people engage across borders and communicate?" Observations and interviews are the methods that were used to gather data for this research. Finding the right strategies for utilizing music to the fullest extent while also acknowledging the range of musical meanings around the world is crucial. Understanding music as a platform for collaboration and discussion requires a multilateral view on musical and international relations that takes into account the efforts of states, international organizations, and non-state actors. This research recommend that music is a key foe peace and conflict resolution and is one of the development of enduring relationships between the world's peoples may lead to peacebuilding.

**Keywords:** Music and International Relations, Peace and Conflict Resolution, Music and Peace, Acoustic turn in International Relations, Cultural Diplomacy

[1] Department of Musicology, Faculty of Music, University of Visual and Performing Arts
sandyabeywardana@gmail.com

# Session 03

| ID | Topic | Author |
|---|---|---|
| **MU/IRS/01** | මාතර සම්ප්‍රදායේ ගම්මඩු ශාන්තිකර්ම ආශ්‍රිත උඩැක්කි ගායන හා වාදන විධි | පී. පී. කේ. ඩී. ආරච්චිගේ |
| **MU/IRS/03** | පහතරට බෙර වාදනයේ ප්‍රස්තාරකරණය සඳහා බටහිර ඩ්‍රම්කිට් ප්‍රස්තාරකරණයේ ආභාසය | රවිපති උත්පල කන්දගේ |
| **MU/IRS/04** | අප්‍රිකානු අවනද්ධ භාණ්ඩ හා බැඳි ජන ඇදහිලි හා විශ්වාස | වී. කේ. ඒ. චමෝදයා රශ්මිප්‍රභා කුරුප්පු |
| **MU/IRS/12** | ස්වයං නිර්මිත සංගීත භාණ්ඩ: ශ්‍රී ලාංකේය ථුංපට බෙරය පිළිබඳ අධ්‍යයනයක් | ඩබ්. එම්. රනුල් කල්හාර පුංචි බණ්ඩා |
| **MU/IRS/17** | තන්ත්‍රී වාද්‍යයන්හි තන්ත්‍ර නාමකරණය: වයලීනයේ තන්ත්‍ර නාමකරණය සඳහා කුමාරතුංග මුනිදාසගේ ප්‍රවේශය පිළිබඳ අධ්‍යයනයක් සහ ඒ ඇසුරින් කැරෙන නව හඳුන්වා දීමක් | දිලංජන මධුෂාන් පතිරණ |
| **MU/IRS/19** | A study on practicing western music instruments among teens (With special reference to 12yrs to 18yrs) | W. M. Manelka V. Perera |

# මාතර සම්ප්‍රදායේ ගම්මඩු ශාන්තිකර්ම ආශ්‍රිත උඩැක්කි ගායන හා වාදන විධි

**පී. පී. කේ. ඩී. ආරච්චිගේ** [1]

බෙන්තර, රයිගම, මාතර සම්ප්‍රදාය යනු ශ්‍රී ලංකාවේ නිරිතදිග හා දකුණු මුහුදුබඩ ප්‍රදේශ තුළ ව්‍යාප්තව පවතින්නා වූ පහතරට නර්තන සම්ප්‍රදායේ චූල සම්ප්‍රදායන් වේ. ශ්‍රී ලංකාවේ පහතරට ප්‍රදේශවල පැවැත්වෙන දේව ශාන්තිකර්ම අතර ප්‍රධාන තැනක් හිමි වන්නේ සශ්‍රීකත්වය හා සෙත් ශාන්තිය පතා පත්තිනි ඇදහීම මුල්කොටගත් ගම්මඩු ශාන්තිකර්මයටයි. මාතර රංග ශෛලියේ ගම්මඩු ශාන්තිකර්මවල ඇතුළත් එක් පෙළපාලි අංගයක් ලෙස උඩැක්කි ගායනය හා වාදනය දැකිය හැක. මෙය කප් ඉඳුම් මඩු චාරිත්‍රයට අදාළ පෙළපාලි අංගයකි. පහතරට ගම්මඩු ශාන්තිකර්මයේ බෙන්තර හා රයිගම සම්ප්‍රදායන් දෙකෙහි හමුනොවන මාතර සම්ප්‍රදායේ දී පමණක් දක්නට ලැබෙන උඩැක්කි ගායන හා වාදන ශෛලිය සම්බන්ධ විශේෂතා පවතී ද යන්න මෙම පර්යේෂණයේ ගැටලුව වේ. බෙන්තර හා රයිගම සම්ප්‍රදාය දෙකෙහි හමුනොවන උඩැක්කි ගායන හා වාදන පිළිබඳ සුවිශේෂී කරුණු රාශියක් මාතර සම්ප්‍රදාය තුළ හමුවේ යන්න උපන්‍යාසයයි. සමාජයෙන් ගිලිහී යන ශාන්තිකර්ම සංකල්පය පරම්පරාවෙන් පරම්පරාවට පවත්වාගෙන යැමට පිරිසක් නොමැති තරම් ය. මෙම ගායන හා වාදනයන්හි සංගීතමය ලක්ෂණ පිළිබඳ අධ්‍යයනයක නිරත වීමත්, සංරක්ෂණය කරලීමත් මෙම පර්යේෂණයේ අරමුණයි. පර්යේෂණ නියැදිය ලෙස දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ හක්මන පොත්තේවෙල නමැති ග්‍රාමයේ ගම්මඩු ශාන්තිකර්මයේ උඩැක්කි වාදන හා කවි ගායනා මෙම අධ්‍යයනය සඳහා යොදා ගැනුණි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේද අනුගමනය කෙරුණු අතර, සහභාගිත්ව නිරීක්ෂණය, සාහිත්‍යගත මූලාශ්‍රය අධ්‍යයනය හා කපු පත්තිනි මහතා සමඟ සිදු කළ සම්මුඛ සාකච්ඡාව ඇසුරින් තොරතුරු එක්රැස් කෙරිණි. තොරතුරු විග්‍රහයෙන් උඩැක්කි වාදනය කෙටි කවි හා උපත් සන්නවලින් යුක්ත ය. ස්වර හතරකට පමණක් සීමා වූ නාද මාලාවන්ගෙන් යුක්ත ය. උඩැක්කි වාදනය ගායනයට රැකුලක් මිස ඝෝෂාකාරී ලෙස වාදනයේ නොයෙදේ. උඩක්කි පද පහතරට බෙර පදයන්ට ආවේණික අක්ෂර භාවිත වන හෙයින් නිවැරදි තිත් රූපවලට වෙන්කර ගැනීමට පහතරට බෙර පද පිළිබඳ මනා අවබෝධයක් තිබිය යුතුය යන්න නිගමනය කළ හැකිය.

**ප්‍රමුඛ පද:** ගම්මඩු ශාන්තිකර්මය, උඩැක්කිය, පහතරට නර්තන සම්ප්‍රදාය, පහතරට බෙර පද, සන්න

[1] මානවවංශ සංගීත විද්‍යා අධ්‍යයනාංශය, සංගීත පීඨය pamudhikadandeniya98@gmail.com

# පහතරට බෙර වාදනයේ ප්‍රස්තාරකරණය සඳහා බටහිර ඩ්‍රම්කිට් ප්‍රස්තාරකරණයේ ආභාසය

**රවිපති උත්පල කන්දගේ** [1]

යම් සංගීත ප්‍රස්තාරකරණයක් නිර්මාණය කරන නිර්මාපකයාගේ අරමුණ වන්නේ එම සංගීත ප්‍රස්තාරය කියවා වාදනය/ගායනය කරන තැනැත්තා විසින් එය ප්‍රතිධ්වනි ගැන්වීමයි. සංගීත ප්‍රස්තාරය වඩාත් සවිස්තරාත්මක වන තරමට වාදකයකු/ගායකයකුගේ ප්‍රාසංගික බව වඩාත් නිවැරදි වනු ඇත. පහතරට බෙර වාදනය සඳහා ද ප්‍රස්තාරකරණයක් එම සම්ප්‍රදායේ දැනටමත් පවතින නමුත් එය සම්පූර්ණ ක්‍රමවත් එකක් නොවේ. එබැවින් පහතරට බෙර වාදනයේ ක්‍රමවත් ප්‍රස්තාරකරණයක් සඳහා වෙනත් විධිමත් සංගීත සම්ප්‍රදායක ආභාසය ලබාගත හැකි බව පෙනී යන්නකි. ඒ අනුව පහතරට බෙර වාදනයේ ප්‍රස්තාරකරණය සඳහා බටහිර සංගීත ප්‍රස්තාරකරණයේ ආභාසය ලබාගත හැකි ද යන්න මෙහි ගැටලුවයි. පහතරට බෙර වාදනයට ක්‍රමවත් ප්‍රස්තාරකරණයක් සඳහා බටහිර සංගීතාත්මක ප්‍රස්තාරකරණයක් හඳුන්වාදීම සහ ඒ මගින් පහතරට බෙර වාදනයට ක්‍රමවත් ප්‍රස්තාරකරණයක් නිර්මාණය කිරීම මෙකී පර්යේෂණයේ අරමුණයි. බටහිර අවනද්ධ සහ තාල වාද්‍යයන්ගේ ප්‍රස්තාරකරණය අධ්‍යයනය මගින් සහ බටහිර අවනද්ධ වාදනය වෙනුවෙන් මෙතෙක් සිදු කොට ඇති නිර්මාණාත්මක අවනද්ධ ප්‍රස්තාර ඇසුරු කිරීම මෙහි පර්යේෂණ ක්‍රමවේදයයි. ඕනෑම අවනද්ධ වාදනයක් තාලානුකූල සහ තාලානුකූල නොවන අයුරින් පවතින අතර, ඇතැම් අවනද්ධ වාදන ඛණ්ඩ තාලානුකූල නොවන අන්දමින් වාදනය වුව ද එය එසේ සිදු වන්නේ අදාළ වාදන ඛණ්ඩ අවස්ථෝචිතව යොදා තිබීම සහ අදාළ වාදනයේ ගති ලක්ෂණය නිසාවෙනි. මේ තත්ත්වය අවනද්ධ භාණ්ඩයක් ලෙස භාවිත කළ හැකි පහතරට බෙර වාදනයේ දී ද දැකිය හැකිය. පහතරට බෙර වාදනයේ පවතින සංකීර්ණ අවස්ථා ලේඛනගත නොවීමෙන් එම අවස්ථා අභාවිත වීමට බොහෝ ඉඩකඩ ඇත. පහතරට බෙර වාදනයේ ඇති මූලික අක්ෂර සහ හරඹ වාදනයේ සිට සංකීර්ණ පද වාදනය, බටහිර ප්‍රස්තාරකරණයේ පවතින ක්‍රමවත් සටහන් කිරීම මගින් පහතරට බෙර වාදන සම්ප්‍රදාය සඳහා ද එවන් ප්‍රස්තාරකරණයක් හඳුන්වාදීමට හැකි වනු ඇත. මෙම පර්යේෂණය මගින් පහතරට බෙර වාදන ශිල්පය නව මගකට යොමු කිරීමට සහ දෙස් විදෙස්හි අවධානය පහතරට බෙර වාදනය වෙත යොමු කිරීම කළ හැකිය.

**මුඛ්‍ය පද :** පහතරට බෙර වාදනය, ප්‍රස්තාරකරණය, අවනද්ධ, බටහිර සංගීතය

[1] බටහිර සංගීත අධ්‍යයනාංශය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය ravipathikandage@gmail.com

# අප්‍රිකානු අවනද්ධ භාණ්ඩ හා බැඳි ජන ඇදහිලි හා විශ්වාස

**වී. කේ. ඒ. චමෝද්‍යා රශ්මිප්‍රභා කුරුප්පු**[1]

අවනද්ධ යනු කුහරයක් සහිත ඝන වස්තුවකට, රාමුවකට සමක් ඇද නිර්මාණය කරන ලද සමක් කම්පනය කිරීමෙන් නාදය උත්පාදනය වන වාද්‍ය භාණ්ඩ වේ. ලොව පුරා ඇති අවනද්ධ භාණ්ඩ අතරින් අප්‍රිකානු ජන සමාජයට අයත් අවනද්ධ භාණ්ඩ සුවිශේෂී වේ. මේවා වසර අටසියයකටත් එහා ආදිවාසී යුගය දක්වා දිව යයි. අප්‍රිකානු අවනද්ධ භාණ්ඩ, එම ජන සමාජයේ ඇදහිලි හා විශ්වාසයන් සමඟ බැඳී පවතින්නේ ද යන්න මෙම පර්යේෂණයේ ගැටලුවයි. අප්‍රිකානු ජන සමාජයේ සමාජීය අවශ්‍යතාවක් වන ඇදහිලි හා විශ්වාසයන්හි ප්‍රධානත ම සාධකයක් ලෙස අප්‍රිකානු අවනද්ධ භාණ්ඩ භාවිත වේ යන්න මෙහි උපන්‍යාසයයි. අප්‍රිකානු අවනද්ධ භාණ්ඩ පිළිබඳව අප්‍රිකානු ජන සමාජය තුළ පවතින විශ්වාස සහ එම අවනද්ධ භාණ්ඩ සමඟ බැඳී පවතින අප්‍රිකානු ජන ඇදහිලි අධ්‍යයනය කිරීම මෙකී පර්යේෂණයේ අරමුණු වේ. පර්යේෂණ නියැදිය ලෙස අප්‍රිකානු අවනද්ධ භාණ්ඩ අතුරින් ජෙම්බේ බෙරය අධ්‍යයනය සඳහා යොදා ගැනුණි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය අනුගමනය කෙරුණු අතර, සාහිත්‍යාගත මූලාශ්‍රය අධ්‍යයනයෙන් සහ සංගීත ආචාර්යවරුන් සමඟ සිදු කළ සම්මුඛ සාකච්ඡා ඇසුරින් තොරතුරු එක්රැස් කෙරිණි. එකී දත්ත විග්‍රහයෙන් අප්‍රිකානු අවනද්ධ භාණ්ඩ ආගමික අවශ්‍යතාවක් බව තහවුරු විය. අවනද්ධ භාණ්ඩ පූජනීය වස්තුවක් ලෙස අප්‍රිකානු ජන සමාජය තුළ සලකනු ලැබේ. අප්‍රිකානු බෙර නිර්මාණය කිරීමට ගසක් කැපීමට පෙර ගසෙන් අවසර ලබා ගනියි. අවනද්ධ භාණ්ඩ නිර්මාණය වෙනුවෙන් ම වෙන් වූ පරම්පරා දැකිය හැකි අතර, බෙරය නිර්මාණය කිරීමෙන් පසු ව එය ආත්ම තුනක් ඇති ජීවමාන වස්තුවක් ලෙස පූජනීයත්වයට පත් කෙරෙයි. අප්‍රිකානු ජන සමාජයේ විවාහ, අවමංගල ආදි අවස්ථාවල දී ආශිර්වාද පතා බෙර වාදනය කරන අතර, ආගමික පුදපූජා පැවැත්වීමේ දී අප්‍රිකානු අවනද්ධ භාණ්ඩ පූජනීයත්වයෙහි සලකා වාදනය කරනු ලැබේ. බෙර වාදනයේ දී එහි ශිල්පීය දක්ෂතා මනා ලෙස විදහා දක්වමින් වාදනය කළ හැකි වන්නේ ඔවුන්ගේ මියගිය අතීත මුතුන්මිත්තන්ගේ ආශිර්වාදාත්මක බලපෑම නිසා බව අප්‍රිකානු ජන සමාජයේ පවතින විශ්වාසයයි. ඒ අනුව අප්‍රිකානු ජන සමාජය තුළ භාවිත වන අවනද්ධ භාණ්ඩ අප්‍රිකානු ඇදහිලි හා විශ්වාස සමඟ බැඳී පවතින පූජනීය තත්ත්වයෙහි ලා සලකන බව නිගමනය කළ හැකිය.

**ප්‍රමුඛ පද** - අවනද්ධ භාණ්ඩ, අප්‍රිකානු ජන සමාජය, ජන ඇදහිලි, ජෙම්බේ බෙරය, ශිල්පීය දක්ෂතා.

[1] උත්තර භාරතීය සංගීත අධ්‍යයනාංශය, සංගීත පීඨය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
chamorashmiprabha2@gmail.com

# ස්වයං නිර්මිත සංගීත භාණ්ඩ: ශ්‍රී ලාංකේය ඵුංපට බෙරය පිළිබඳ අධ්‍යයනයක්

**ඩබ්. එම්. ආර්. කේ. පුංචි බණ්ඩා**[1]

පහතරට පාරම්පරික නැටුම් ශිල්පියෙකු වන ඇල්පිටියගේ ඩයිනිස් විමලසේන විසින් නිර්මිත ප්‍රථම භාණ්ඩය නම්කොට ඇත්තේ 'ඵුංපට බෙරය' නමිනි. පදම් කළ මැටිවලින් සාදන ලද සමාන ප්‍රමාණයේ කළ ගෙඩි දෙකක් ඇසුරින් සකසා ඇති මෙකී බෙරය සෑදීම ආරම්භ කරනුයේ නැකත් චාරිත්‍ර අනුව ය. මෙය බිම හිඳ වාදනය කිරීම සාමාන්‍ය පිළිවෙත ය. අවනද්ධ කාණ්ඩයට අයත් සංගීත භාණ්ඩයන්ගේ දක්නට ලැබෙන බෙර ඇස, බඳ, සම්බන්ධක රැහැන් ආදි මූලික උපාංග කිහිපයක් ඵුංපට බෙරයෙහි දක්නට ලැබිණ. ඵුංපට බෙරය හඳුනාගැනීම, වාදන කරන පද සහ ශිල්ප ක්‍රම අධ්‍යයනය කිරීම, එහි උපයෝගිතාව පිළිබඳ සාකච්ඡා කිරීම මෙම අධ්‍යයනයේ අරමුණු විය. විමලසේන ඇල්පිටිය ශිල්පියා සතු අත්පිටපත් පරීක්ෂා කිරීමෙන් සහ බෙර උපත සහ භාණ්ඩය පිළිබඳ සම්මුඛ සාකච්ඡා මඟින් ලබා ගත් දත්ත මෙන් ම ක්ෂේත්‍ර නිරීක්ෂණයේ ලබා ගත් ඡායාරූප හා දෘශ්‍යපට ද මෙහිලා භාවිත කෙරිණ. ලෝකයේ භාවිත මූලික බෙර හැඩයන්ගෙන් Pot හැඩය ගන්නා භාණ්ඩයක් වන මෙය වාදනය කිරීමේ දී හස්තයේ ඇඟිලි, ඇඟිලි තුඩු, අත්ල භාවිත කරමින් ධ්වනි උත්පාදනය කෙරෙයි. වරපට ඇදීමෙන් හා බීරළු තද කිරීම මඟින් ඵුංපට බෙරය සුසර කරගැනෙයි. එහි නාද නිෂ්පත්තිය සහ ධ්වනි උත්පාදනය සඳහා ඉවහල්වන ශිල්පක්‍රමවල ද විශේෂතා පවතී. බෙරයෙහි දකුණු පැත්ත අවශ්‍ය ශ්‍රැතිය අනුව සුසර කළ හැකි වීම ද දැකිය හැකි වූවකි. දිරාපත්වන ස්වාභාවික සම්පත් උපයෝගි කරගැනීම, අඩු පිරිවැය, භාවිතයට පහසු වීම, කුඹල් කර්මාන්තය සමග සංහිඳියාව සහ එමගින් කර්මාන්ත දෙකක ප්‍රවර්ධනයට හේතු වීම මෙන්ම ගස්වල කඳන් යොදාගැනීමට (සංරක්ෂිත ශාක) විකල්පයක් ලෙස මැටි යොදා සැකසූ භාණ්ඩ භාවිතය මෙකී නව නිපැයුමෙහි තිරසරබව දිස්වන්නකි. මෙහි දුර්වලතා ලෙස දැක්විය හැක්කේ බිඳෙන සුලුවීම හා එනිසා ප්‍රවාහනයේ දී වැඩි සැලකිල්ලක් දැක්විය යුතු වීම ය. තව ද නව නිෂ්පාදිතය ඇගයුම්, සම්මාන, වැඩසටහන් සඳහා පමණක් සීමා වීම, නිෂ්පාදනයට දිරිදීමක් නොවීම, නව නිෂ්පාදිතය සඳහා වෙළඳපොළක් නොතිබීම, ශිල්පියාගේ ආර්ථික අපහසුතා ගැටලු, සංරක්ෂණයක් නොවීම ද මෙහිදී දිස් වූවකි. කෙසේ වුව ද **ඵුංපට බෙරය** යනු ස්වයං නිර්මිත සංගීත භාණ්ඩයකි. මෙය බුම්මැඩිය ඇසුරු කරගනිමින් ද බුම්මැඩියට වඩා සංකීර්ණ ආකෘතියකට අනුව නිමවන ලද්දකි. බෙර වාදන සම්ප්‍රදායෙහි වාදනය කරන බීජාක්ෂර තාල පද මෙන්ම නව නිර්මාණාත්මක නර්තන හා සංගීත අංග සඳහා ද වාදන සහය ලෙස මෙය යොදාගත හැකිය. ඵුංපට බෙරයෙහි සැකැස්ම සහ ව්‍යුහකරණය මීට පෙර පැවති කළ බෙරවලට වඩා වෙනස් මුහුණුවරක් ගෙන තිබීම නිරීක්ෂණය වූවකි.

**ප්‍රමුඛ පද** - අවනද්ධ භාණ්ඩ, නව නිපැයුම්, සංගීත භාණ්ඩ පරිණාමය, බුම්මැඩිය,
කළ බෙරය, සංස්කෘතික මතක

[1] දංකොටුව, යෝගියාන, දර්ශන-ශෙහානි කලායතනය rkpbt2005@gmail.com

# තන්ත්‍රී වාද්‍යයන්හි තන්ත්‍ර නාමකරණය: වයලීනයේ තන්ත්‍ර නාමකරණය සඳහා කුමාරතුංග මුනිදාසගේ ප්‍රවේශය පිළිබඳ අධ්‍යයනයක් සහ ඒ ඇසුරින් කැරෙන නව හඳුන්වා දීමක්

**දිලංජන මධුෂාන් පතිරණ**[1]

තන්ත්‍රී වාද්‍යයන්හි තත් හැඳින්වීම සඳහා පෙර'පර දෙදිගෙහි ම පිළිගත් ක්‍රමවේදයක් සහ නාමකරණ ඇත. ඒ වනාහි බටහිර ස්වර සංඥා ඇසුරින් සිදු කැරෙන අනු අංකනයකි. ප්‍රථම වරට සිංහලයට අනන්‍ය තන්ත්‍ර නාමකරණයක් පිළිබඳ අදහසක් ගෙන හැර පෑවේ කුමාරතුංග මුනිදාස ය. ඒ, සිංහල සංගීත සම්ප්‍රදායයක් පිළිබඳ ඔහුගේ අභිනව මතවාදය සමඟ සංගීතය ඉගැන්වීමේ ප්‍රාරම්භ ග්‍රන්ථයක් වශයෙන් 1942 දී පළ කළ "හෙළ මීයැසිය"පළමුවැනි වෙළුමෙනි. මූලික වයලීන ශික්ෂණ අවශ්‍යතාවන්ට සීමා වූ කුමාරතුංග එහි තත් සතරෙන් අභිනව නාමයන් යෝජනා කර ඇත්තේ $E1^{st}$ සහ $A2^{nd}$ තත් දෙක සඳහා පමණි. පිළිවෙළින් "කොවුල් තත" සහ "බමර තත" වශයෙනි. ගුණාත්මක දත්ත විශ්ලේෂණය මත පදනම් වන මේ අධ්‍යයනයේ ගැටලුව වනුයේ තත්ත්‍ර නාමකරණය සඳහා කුමාරතුංග මුනිදාස එළැඹි න්‍යායික ආස්ථානය කුමක් ද? යන්නයි. ඒ ඇසුරින් තන්ත්‍රී වාද්‍යයන්හි තන්ත්‍ර නාමකරණය සඳහා පරිපූර්ණ නව ක්‍රමවේදයක් හඳුන්වාදීම මේ අධ්‍යයනයේ ප්‍රමුඛ අරමුණයි. කෝට්ටේ යුගයේ දී වෑත්තෑවේ හිමි විසින් රචනා කරන ලද "ගුත්තිල කාව්‍යය" කුමාරතුංග මුනිදාසගේ ප්‍රවේශය සඳහා බලපා ඇති බව පැහැදිලි ය. එහි සඳහන් "බමර තත පළමුවෙන් සිඳපී" යන පද්‍ය ඛණ්ඩය සඳහා විවරණ සපයා ඇති දෙස්විදෙස් විචාරක මතවාද සංක්ෂේප කළ හොත් "බමර තත" වනුයේ තන්ත්‍රී වාද්‍යයෙක මුල් ම තත (වමේ සිට දකුණට) හෙවත් මන්ද්‍රතම තතයි. එහෙත් කුමාරතුංග මුනිදාස විවරණය කරනුයේ වීණාවේ ප්‍රධාන තත "බමර තත" බවයි. ඔහුගේ ඒ මතය සසාධක ව තහවුරු කළ හැක්කක් නොවන නමුත් මධ්‍ය "ප" ස්වරයට සුසර කරන ලද තත ($E1^{st}$) "කොවුල් තත" යනුවෙන් හැඳින්වීම සංස්කෘත සංගීත සම්ප්‍රදායයේ දක්වෙන සත්ත්ව හඬ අනුකාරක ධ්වනි සංකල්පය හා ඉඳුරා සැසැඳෙයි. ඒ පිළිබඳ සංස්කෘත මතවාද අතුරින් සංගීතරත්නාකරකාර ශාරංගදේවගේ මතය සිංහල ජන සාහිත්‍යාගත පද්‍යන්ට ද බලපා ඇති බැවින් එකී න්‍යායික ආස්ථානය මත පදනම් ව කුමාරතුංග මුනිදාසගේ ප්‍රවේශය වර්ධනය කළ හැකි ය. ඒ අනුව ස (C), රි (D), ග (E), ම (F), ප (G), ධ (A), නි (B) යන සප්ත ස්වරයන්හි අනුකාරක ධ්වනිවලට අදාළ සත්ත්ව නාමයන්ගෙන් උපයුක්ත තත හැඳින්වීම සාධනීය වෙයි. මෙය ඕනෑ ම භාෂාවකින් ව්‍යවහාර කළ හැකි බැවින් ලෝක සංගීත සාහිත්‍යයට ද, සාහිත්‍ය නිර්මාණකරුවන්ට ද වෙසෙසින් වැදගත් වනු ඇත.

**ප්‍රමුඛ පද:** අනුකාරක ධ්වනි, කුමාරතුංග මුනිදාස, තත්ත්‍ර නාමකරණය, සංස්කෘත සංගීත සම්ප්‍රදායය, සාහිත්‍යය

[1] ලලිත කලා අධ්‍යයනාංශය, ශාස්ත්‍ර පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
dilanjana.mp@gmail.com

# A study on practicing western music instruments among teens (With special reference to ages 12 yrs to 18yrs)

**W.M. Manelka V. Perera**[1]

The study of Western Music Instruments is beneficial for students in many ways such as enhancing coordination, perseverance and developing listening skills in addition to metacognition. In recent years there has been a decline in the number of students who continue playing instruments into adulthood with most students dropping out between the ages 12 – 18 with inconsistencies in practice. The purpose of this study is to identify the reasons for inconsistent practice and the reasons why students discontinue studies of Western Music. Qualitative Research Methods were used in this research, books, journals, questionnaires have been used as secondary data. As a sample of the research 25 teenage western music students were randomly selected. According to the data, there have been 7 dropouts, 10 students changing streams expressing negative feelings and 8 continuing western music studies. As findings of this research, most students have expressed negative feelings towards music instrument playing due to lack of interest in learning, difficulty in persevering, lack of time management and low priority for practice. This impacts the future of Western Music Studies as the number of students decline continuously leading to the fall of the industry. This also results in a stagnation in personality development in teenagers.

**Keywords:** Higher Education, Music Eductaion, Subject Development, Western Music

[1] Department of Western Music, Faculty of Music, University of Visual and Performing Arts

# Session 04

| ID | Topic | Author |
|---|---|---|
| **MU/IRS/A/02** | ගැටබරු රජමහා විහාරයේ හේවිසි වාදනයෙහි සුවිශේෂීතාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් | ආර්. එම්. පී. එස්. වීරසූරිය,<br><br>ඩී. එම්. එස්. පියුමාලි |
| **MU/IRS/A/10** | කොහොඹා කංකාරියේ රංග ප්‍රවර්ග | මහින්ද විමලසිරි |
| **MU/IRS/A/39** | නර්තනය, තාක්ෂණය සහ අන්තර්ජාල රැකියා අවස්ථා | ටී. ඩබ්. ජී. ඩී. සඳරුවන් |
| **MU/IRS/A/13** | නිර්මාණාත්මක නර්තන කලාව සඳහා ආලෝක තටාක නිර්මාණකරණය | අජිත් රෝහණ කුමාර |
| **MU/IRS/A/36** | උඩරට බෙර වාදන සම්ප්‍රදාය තුළ දක්නට ලැබෙන යුගල අලංකාර බෙර වාදනයෙහි විශේෂතා<br>(මූලික බෙර සරඹයක් ඇසුරෙනි) | ජේ. ජයන්ත පුෂ්පකුමාර |
| **MU/IRS/A/45** | සබරගමු නර්තන කලාවේ වත්මන් ප්‍රාසංගික මුහුණුවර | ඊ. එම්. එන්. ඩී. ජයසේන |

# ගැටබරු රජමහා විහාරයේ හේවිසි වාදනයෙහි සුවිශේෂීතාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ආර්. එම්. පී. එස් වීරසූරිය / ඩී. එම්. එස්. පියුමාලි [1]

බෙර වාදන කලාවේ දී හේවිසි වාදනය සඳහා විශේෂ ස්ථානයක් හිමිවේ. සිරිලක දකුණු ප්‍රදේශයට අයත් ගැටබරු රජමහා විහාරයේ රජ්ජුරු බණ්ඩාර දෙවියන් වෙනුවෙන් සිදු කරනු ලබන හේවිසි වාදනය වැදගත් වන අතර, මෙය හැට පැය හේවිසි වාදනය ලෙස හැඳින් වේ. මෙම පූජා කර්මය වාර්ෂිකව සිදු කරනු ලැබේ. අතීත ජනතාව දිනක් ගත වීම සඳහා පැය 60 ක කාලයක් ගත වන බව විශ්වාස කරන ලදී. මෙම විශ්වාසය පදනම් කරගනිමින් ගැටබරු රජ මහා විහාරයේ නොනවත්වා දිනක් රැය පහන් වන තුරු හේවිසි වාදනය සිදු කරන අතර, එම කරුණ පදනම් කරගනිමින් මෙම රජ්ජුරු බණ්ඩාර දෙවියන් වෙනුවෙන් පවත්වන හේවිසි වාදනය හැට පැය හේවිසි වාදනය ලෙස හඳුන්වයි. ගැටබරු රජමහා විහාරයේ හේවිසි වාදනයෙහි සුවිශේෂිතා පවතී ද යන ගැටලුව මූලික වෙමින් මෙම පර්යේෂණය සිදු කළ අතර, මෙම හේවිසි වාදනයෙහි සුවිශේෂතා පවතිනවා මෙන් ම සාමාන්‍ය හේවිසි වාදනයට සාපේක්ෂව විශේෂ ලක්ෂණ මෙහි අන්තර්ගතය යන උපන්‍යාසය මත මෙම පර්යේෂණය සිදු කරන ලදී. මෙහි දී මෙම හැට පැය හේවිසි වාදනයෙහි ගායන හා වාදන අංග, පූජා විධි රටාව, වාදන ශිල්පීන්ගේ ඇඳුම් පැළඳුම්, වාදන භාණ්ඩ පිළිබඳ අධ්‍යයනයෙහි අන්තර්ගත විය. දත්ත රැස් කිරීමේ ක්‍රමවේද ලෙස ගුණාත්මක දත්ත රැස් කිරීමේ ක්‍රමවේදය හා කතිකා විග්‍රහය නැමති පර්යේෂණ ක්‍රමවේද භාවිත විය. එහිදී ප්‍රාථමික මූලාශ්‍රය හා ද්විතීයික මූලාශ්‍රය යොදා ගනු ලැබිණි. ද්විතීයික මූලාශ්‍රය මඟින් දත්ත රැස් කිරීමේ දී ක්ෂේත්‍ර අධ්‍යයනය හා ගැටබරු රජමහා විහාරයේ හැට පැය හේවිසි වාදනයේ ප්‍රධාන සංවිධායකයින් හා ශිල්පීන් සමඟ සම්මුඛ සාකච්ඡා සිදු කළ අතර ග්‍රන්ථ, ලිපි ලේඛන පරිශීලනය සිදු කරන ලදී. දත්ත විශ්ලේෂණය කරමින් ලාංකේය හේවිසි වාදනයට සාපේක්ෂව හැට පැය හේවිසි වාදනයේ සුවිශේෂ සාම්ප්‍රදායික ගායන හා වාදන අංග පවතින බව ද, පූර්ව භාග හා අපර භාග ලෙසට වාදන අංග සහිතව පූජා විධි රටාවක් පවතින බව ද, මෙය නොකඩවා පුරා දිනක් එක දිගට වාදනය කරන බව ද, යම් ශිල්පීන් පහතරට මුතු ඇඳුම් කට්ටලය අඳිමින් මෙම හේවිසි වාදනය සිදු කරන බව ද පැහැදිලි විය.

**ප්‍රමුඛ පද-** හේවිසි වාදනය, බෙර වාදන කලාව, පුද පූජා සංස්කෘතිය, සාම්ප්‍රදායික ගායන අංග

[1] බාහිර කථිකාචාර්ය (SLITHM), සහකාර කථිකාචාර්ය, ශ්‍රී පාලි මණ්ඩපය
prasad.weerasooriya1@gmail.com

# කොහොඹා කංකාරියේ රංග ප්‍රවර්ග

**මහින්ද විමලසිරි** [1]

කොහොඹා කංකාරිය වූ කලී හැටපස් මංගල්‍යයකින් වර්තමානයට ශේෂ වී ඇති සංස්කෘතික උරුමයකි. එය උඩරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධානතම ශාන්තිකර්මය බවත් එකී සම්ප්‍රදායේ කෝෂ්ඨාගාරය වන බවත් පර්යේෂණ මඟින් අනාවරණය කර තිබේ. එසේ වුව ද කොහොඹා කංකාරියේ සමස්ත කාර්යාවලිය පිළිබඳ ගැඹුරින් අධ්‍යයනය කරන කල්හි පැහැදිලි වන්නේ එය භරතමුණිගේ නාට්‍ය සංකල්ප, මූලධර්ම මුල්කොට ගනිමින් ඓතිහාසික කතා පුවතක් නිරූපණය කරන විදග්ධ රංග කාර්යයක් බව ය. ඒ බව සාම්ප්‍රදායික සිංහල නාට්‍ය ආකෘතිය හා කොහොඹා කංකාරි ශාන්තිකර්ම රංග ආකෘතිය සංසන්දනය කිරීමෙන් හේතුප්‍රත්‍ය සහිත ව තහවුරු කළ හැකි ය. ශ්‍රී ලාංකේය නර්තන හා රංග කලා පිළිබඳ අධ්‍යයන යටත්විජිත සමයේ මෙහි සේවය කළ යුරෝපීය සිවිල් සේවකයින්, මිෂනාරීන් සහ ශාස්ත්‍රඥයින් විසින් ආරම්භ කර තිබේ. ඔවුහු දේශීය රංග කලා ඇගැයුමට ලක්කර ඇත්තේ යුරෝපීය රංග කලා මූලධර්ම පදනම් කොට ගෙන ය. එකී ඇගැයුම් යුරෝකේන්ද්‍රීය (Eurocentric) හා ජනවර්ගකේන්ද්‍රීය (Ethnocentric) දෘෂ්ටි කෝණයෙන් සිදු කළ අධ්‍යයන බව රංග කලා විචාරයේ දී හඳුනාගත හැකි ය. මේ නිසා මුල් යුගයේ දී කාරිය, කංකාරිය, කොහොඹා කංකාරිය, කොහොඹා යක්කම ආදි නාමවලින් හඳුන්වන ලද රංගකාර්යයන් ශාන්තිකර්ම (Rituals) බවට නිර්වචනය කර තිබේ. එමෙන් ම ඒකදේවවාදී ආගමික සංකල්පයෙහි නිමග්න ව සිටි යුරෝපීයන් උඩරට වෙස් නැටුම යක්ෂ නැටුම් (Devil dance) ලෙස ද සිංහලයින්ගේ යක්ෂ නැටුම් (Sinhalese Devil dance) යනුවෙන් ද හඳුන්වා තිබේ. එකී ඇගයුම් හා නිර්වචන නිවැරදි කිරීමට යටත්විජිත යුගයේ රාජකීය ආසියාතික සංගමයට දීර්ඝ ලිපියක් Kandyan Music නමින් පළ කල මහවෙලතැන්න බණ්ඩාර මෙන්ම ආතර් සිල්වා වැනි ප්‍රභූන්ටත් සිංහල ගැමි නාටකය ලියු එදිරිවීර සරච්චන්ද්‍රටත් ඉන්පසුව නර්තන ක්ෂේත්‍රයේ බිහි වූ විදග්ධයින්ටත් මග හැරී ඇති බව අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වේ. යුග ගණනාවක ඇවෑමෙන් අද්‍යතනයේ අප අත්විඳින්නේ කොහොඹා කංකාරියේ මූලික ස්වරූපය පවා හඳුනාගැනීමට අපහසු අවභාවිත හා විකෘතිකරණයට හසු වූ පරිහානියට පත් රංග කාර්යයකි. මුඛ පරම්පරාගත ව පිය පුතු හෝ ගුරු ගෝල පදනමින් පාරම්පරික ව පැවතීම හේතුවෙන් ඒ පිළිබඳ ශාස්ත්‍රීය අවබෝධය ක්‍රමයෙන් අවම වීම ද ඊට බලපා ඇති ප්‍රධාන හේතු සාධකයකි. එමෙන්ම එකී ස්වභාවය පිළිබඳ අවබෝධයකින් තොරව නූතන ස්වරූපය පමණක් නිරීක්ෂණය කර පර්යේෂණ හා ප්‍රකාශන සිදු කිරීම මඟින් ද මෙම රංග කාර්යයෙහි නිවැරදි දිශානතිය වසන් වී ඇත. එබැවින් කොහොඹා කංකාරිය යනු අධිභෞතික සංකල්ප උදෙසා අභිචාර විධි ඉටු කෙරෙන ප්‍රාකෘතික කාර්යාවලියක් නොවනබව තහවුරු කර එහි අන්තර්ගත සම්භාව්‍ය රංග ආකෘති හඳුනාගැනීම මෙම පර්යේෂණ කාර්යයේ ප්‍රධාන අරමුණ වේ. කොහොඹා කංකාරිය යනු ශාන්තිකර්මයක් ද? නැතහොත් රංග කාර්යක් ද? යන්න මෙම පර්යේෂණයේ ගැටලුව යි. උපන්‍යාසය වනුයේ කොහොඹා කංකාරිය යනු ශාන්තිකර්මයක් නොව භරතමුණිගේ නාට්‍ය ශාස්ත්‍රය පදනම් ව සකස්කරන ලද රංගයක් බවයි. එමගින් එම

---

[1] ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, නර්තන හා නාට්‍ය කලා පීඨය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

රංගයේ ප්‍රතීයමාන නෘත්‍ය නාටක, කවි නළු, නාට්‍ය හෙවත් යක්කම්, වාර්තා රංග ආදි රංග ප්‍රවර්ග වෙන්කොට හඳුනාගැනීමට ද අපේක්ෂිත ය. මෙම පර්යේෂණ කාර්යයේ ක්‍රමවේදය ලෙස ලිඛිත හා අලිඛිත මූලාශ්‍රය අධ්‍යයනය යොදාගනු ලැබේ. ලිඛිත තොරතුරු අධ්‍යයනයේ දී ප්‍රාථමික මුලාශ්‍රය ලෙස වංසකතා මෙන් ම කොහොඹා කංකාරි ශිල්පීන් සතු අත්පිටපත්, පුස්කොළ පොත් ද ද්විතියික මූලාශ්‍රය ලෙස පර්යේෂණ සහ ප්‍රකාශන ද යොදාගනු ලැබේ. අලිඛිත මූලාශ්‍රය ලෙස නිරීක්ෂණ, සහභාගිත්ව නිරික්ෂණ, සම්මුඛ සාකච්ඡා යොදාගැනෙයි. එම ක්‍රමවේද මඟින් ලබාගන්නා දත්ත ගුණාත්මකව විශ්ලේෂණය කර, අවසන් නිගමනවලට එළඹීමට අපේක්ෂිත ය.

**ප්‍රමුඛ පද** - කංකාරිය, නාට්‍යශාස්ත්‍රය, යුරෝකේන්ද්‍රීය, ජනවර්ගකේන්ද්‍රීය, ශාන්තිකර්ම

# නර්තනය, තාක්ෂණය සහ අන්තර්ජාල රැකියා අවස්ථා

ටී.ඩබ්.ජී.ඩී සඳරුවන් [1]

රැකියාවක්, ආදායම් මාර්ගයක් යනු මේ මොහොතේ අප බොහෝ දෙනෙක් මුහුණු දෙන ප්‍රධාන ගැටලුවකි. පසුගිය වසර 2-3 ක කාල පරාසයේ දී කොවිඩ් 19 වසංගත තත්ත්වය, හමුවේ සිදු වූ ආර්ථික පසුබෑම මෙහි ලා ප්‍රමුඛ සංධිස්ථානයක් විය. මේ නිසා ම බොහෝ දෙනෙකුගේ රැකියා අවස්ථා අහිමි කරමින් බලපෑම් එල්ල කරන ලදී. ශ්‍රී ලංකාවට ද එය එසේ ම ය. සෞන්දර්ය විෂයන් හදාරනන් මෙන් ම, එය වෘත්තීයමය වශයෙන් සිදු කරන්නන්ට මෙම බලපෑම් විසින් එල්ල කරන ලද්දේ අනපේක්ෂිත අත්දැකීමකි. තමන්ගේ වෘත්තීය සිදු කරගැනීමට නොහැකි වූ ඔවුන් මේ නිසා තම නිවෙස්වලට ම මෙම කාලයේ දී සීමා විය. සැලකිය යුතු කරුණක් වන්නේ මෙම කාලසීමාවේ දී තාක්ෂණය උපයෝගී කරගනිමින් බොහෝ දෙනෙකු නිවසේ සිට මුදල් ඉපැයිය හැකි ආදායම් මාර්ග කරා යොමුවීමට උත්සහ දැරීම යි. මෙය ශ්‍රී ලාංකිකයන්ට යම් නුහුරු අත්දැකීමක් වූවත්, තොරතුරු තාක්ෂණය පිළිබඳ හසුරවාගත හැකි දැනුමෙන් පුද්ගලයින් ඒ සඳහා යොමුවිය. මෙහි දී අන්තර්ජාලය හරහා මුදල් සෙවීම පිණිස නොයෙකුත් ක්‍රම අත්හදා බලන්නට ඔවුහු පෙලඹුණහ. නමුත් නර්තනය වෘත්තීය මට්ටමෙන් සිදුකරන සහ එය විශ්වවිද්‍යාල මට්ටමෙන් හදාරන විද්‍යාර්ථීයන්ට එකී රැකියා අවස්ථා පිළිබඳ අවබෝධයක් නොමැතිවීම හේතුවෙන් මෙම කාලසීමාව ඔවුන්ට අතිශය දුෂ්කර කාලසීමාවක් බවට පත්වීමයි. ඒ අනුව, පර්යේෂණ ගැටලුව ලෙස පෙන්වාදිය හැක්කේ නර්තනය, උසස් අධ්‍යාපනය ලෙස හදාරා රැකියාවක් බලාපොරොත්තු වන විද්‍යාර්ථීන්, උපාධිධාරීන් නැත්නම් වෘත්තීය මට්ටමෙන් එය පවත්වාගෙන යන පුද්ගලයන්ට මාර්ගගත (Online) අලෙවිකරණය (Digital Marketing) පිළිබඳ තාක්ෂණික දැනුම ලබා දී එය අර්ධ කාලීන ආදායම් මාර්ගයක් හෝ පූර්ණ කාලීන ආදායම් මාර්ගයක් ලෙස සිදු කළ හැකි ද යන්න යි. මේ සඳහා ආධුනික වන අයෙකුට ඒ සඳහා සපුරාලිය යුතු සුදුසුකම් මොනවාද යන්න අධ්‍යයනය කිරීමත්, එසේ යොමු වී ඇති, මේ වනවිට ඒ හරහා යම් ආදායමක් ලබන්නන් සහ එසේ ඉපයිය හැකි ආදායම් මාර්ග පිළිබඳ පෞද්ගලිකව ම පර්යේෂණය කොට අත්හදා බැලීම යන පර්යේෂණ ක්‍රමවේද ඔස්සේ මේ සඳහා දත්ත සහ තොරතුරු රැස් කරගන්නා ලදී. පර්යේෂණයේ ප්‍රමුඛ අරමුණ වන්නේ තමා සතු දැනුම සහ කුසලතා භාවිතයට ගනිමින් ඊට තාක්ෂණය ද මුසුකරමින් තමන් සතු දැනුම සංරක්ෂණය කරමින් ඒ ඔස්සේ අන්තර්ජාල නිදහස් රැකියා අවස්ථා (Freelancer) උත්පාදනය සිදු කළ හැකි බව පෙන්වාදීම ය.

**ප්‍රමුඛ පද** - නර්තනය, තාක්ෂණය, අන්තර්ජාල (නිදහස්) රැකියා අවස්ථා, ඩිජිටල් අලෙවිකරණය,

[1] බාහිර කථිකාචාර්ය, නර්තන, රංගකලා ඉතිහාසය හා සිද්ධාන්ත අධ්‍යයනාංශය, නර්තන හා නාට්‍ය කලා පීඨය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය danushka.academic@gmail.com

# නිර්මාණාත්මක නර්තන කලාව සඳහා ආලෝක තටාක නිර්මාණකරණය

**අජිත් රෝහණ කුමාර** [1]

රංගභූමියක සිදුවන ක්‍රියාවන් සඳහා ප්‍රේක්ෂකයන්ගේ අවධානය යොමුකරන්නේ රංගාලෝකකරණය යි. නර්තනයේ විවිධ න්‍යාය හා ව්‍යුහයන් දක්නට ලැබෙන අතර, ලාංකේය නිර්මාණාත්මක නර්තනය සාම්ප්‍රදායික නර්තනයේ ව්‍යුහගත ආකෘතීන්ගෙන් බැහැරව ශරීර චලනයේ කලාත්මක බව ඉස්මතු කිරීමට භාවිත කිරීම දක්නට ලැබෙයි. ආලෝක නිර්මාණකරණය සංකීර්ණ වන්නේ රංගන ශිල්පීන් රැසක්, වේගවත් චලන, රංගරටා බහුල වශයෙන් භාවිත වීමයි. නර්තනයේ දර්ශන අංක සහ රංග රටා වෙනස් ආකාරයේ ආලෝක නිර්මාණය මනෝභාවයන් වෙනස් කිරීම ඵලදායි ක්‍රමයක් බව පිළිගැනීමයි. සාම්ප්‍රදායික Front light, Side light, Back light, Foot light, Diagonal light, Spot light යනාදී ක්‍රමවේද අතරට ආලෝක තටාක නිර්මාණකරණය මගින් රංගරටා සඳහා අපේක්ෂිත මනෝභාවය ලබාදිය හැකිදැයි විමසීම මෙහි පර්යේෂණ ගැටලුව වේ. ආලෝක තටාක ක්‍රමය යනු රංගරටාවක් තුළ නිශ්චිත කාලය හා අවකාශය මත ආලෝක පහන් කීපයක් මගින් තටාකයක් නිර්මාණය කිරීම ය (Light pool). එය හුදෙක් තාක්ෂණික ක්‍රියාවලියක් නොවන අතර තාක්ෂණය, නිර්මාණාත්මක චින්තනය හා දර්ශනය විෂයය එක්ව ගොඩනැගෙන ශිල්ප ක්‍රමයක් වෙයි. තව ද සාම්ප්‍රදායික ආලෝක ශිල්ප ක්‍රම මගින් නර්තන නිර්මාණ සංකල්ප හා ප්‍රවේශයන්ට ඒකාකාරී ස්වභාවයක් මතුවන බව නිරීක්ෂණය වෙයි. එය අවම කරමින් නර්තනයට කලාත්මක හා විචිත්‍ර බවක් ලබාගැනිමට ආලෝක තටාක ක්‍රමය යොදාගත හැකි බව මෙහි උපකල්පනයි. ගුණාත්මක පර්යේෂණය ක්‍රමවේදය යටතේ සහභාගිත්ව නිරීක්ෂණ, ක්ෂේත්‍ර අධ්‍යයනය, විද්‍යුත් මූලාශ්‍රය මගින් දත්ත ලබා ගැනිණ. රංගාලෝක සැලසුම්කිරිමේ දී සාම්ප්‍රදායික රංගාලෝක ශිල්පක්‍රම සමග ආලෝක තටාක ක්‍රමය සම්මිශ්‍රව සිදු කිරීම මගින් විෂයේ ප්‍රගමනයට බලපෑමක් ඇති කිරීම පර්යේෂණයේ අරමුණ ය. ආලෝක පහන්වල දිශාවන් සහ නිර්මාණ සංකල්පය, රංගවස්ත්‍ර සහ වර්ණ ආලෝක තටාක නිර්මාණකරණය සඳහා බලපාන බව මෙම පර්යේෂණය මගින් නිගමනය කළ හැකි ය.

**ප්‍රමුඛ පද**: Dance Recitals, Light Pool, Light Technology, Stage Lighting.

[1] කථිකාචාර්ය, උඩරට නර්තන අධ්‍යයනාංශය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

# උඩරට බෙර වාදන සම්ප්‍රදාය තුළ දක්නට ලැබෙන යුගල අලංකාර බෙර වාදනයෙහි විශේෂතා

(මූලික බෙර සරඹයක් ඇසුරෙනි)

**ජේ. ජයන්ත පුෂ්පකුමාර** [1]

දේශීය සිංහල නර්තන සම්ප්‍රදායයන් ත්‍රිත්වය තුළ එකිනෙක සම්ප්‍රදාය හා බැඳී පවතින වාදන සම්ප්‍රදායක් දක්නට ඇත. ඒ අතරින් උඩරට බෙරවාදන සම්ප්‍රදාය අද්විතීය ස්ථානයක් ළගා කරගෙන ඇති බව කිව මනාය. එයින් නර්තනය සමග ඍජු සම්බන්ධයක් වාදනය සතුව පැවතිය ද නර්තනයෙන් වියුක්තව යෙදෙන වාදන සම්ප්‍රදායක් භාවිතයේ ඇති බව වටහා ගත යුතුය. මූලික බෙර සරඹයක් ඇසුරෙන් යුගළ අලංකාර පද වාදනය කළ හැකි ද යන්න මෙහි පර්යේෂණ ගැටලුව වේ. පාදක කරගත් සරඹය පර්යේෂණාත්මක විධිමත් ක්‍රමවේදයක් යටතේ භාවිතයට ගනිමින් මෙකී යුගළ අලංකාර වාදන ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය සඳහා දායක කරගැනීම. මෙහිදී පර්යේෂණයට බඳුන් කරනු ලබන්නේ උඩරට බෙර යුගළයක් භාවිතයට ගෙන අලංකාර පද වාදනය කිරීමේ දී මූලික බෙර සරඹයක ක්‍රියාකාරිත්වය කෙබඳු ස්වරූපයක පිහිටා තිබේ ද යන්න පරීක්ෂා කිරීමයි. එමගින් තනිතිත/දෙතිත /තුන්තිත /සිව්තිත සහ පස්තිත ආදි වශයෙන් විවිධ තාල රූප මත අදාළ මූලික සරඹයේ ක්‍රියාකාරිත්වය හඳුනාගැනීමට අපේක්ෂා කළ අතර, එමගින් කර්ණ රසායන අලංකාර පද කොටස් ලය ගුණ කිරීම් සහිත වාදනයේ දී මතුවන බවත් එකී පද කොටස් බෙදී යාම ප්‍රස්තාර කළ හැකි බවත් නිගමනය කළ හැකිය.

**ප්‍රමුඛ පද**

උඩරට බෙර වාදනය, යුගල බෙර වාදනය, මූලික බෙර සරඹ, අලංකාර පද වාදනය.

[1] ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, වාද්‍ය සංගීත අධ්‍යයනාංශය, නර්තන හා නාට්‍ය කලා පීඨය, සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය uvpa.jayantha@gmail.com

# සබරගමු නර්තන කලාවේ වත්මන් ප්‍රාසංගික මුහුණුවර

ඊ. එම්. එන්. ඩී ජයසේන [1]

සබරගමු නර්තන සම්ප්‍රදාය යනු දේශීය නර්තන සම්ප්‍රදායන් අතරින් ප්‍රධානත ම නර්තන සම්ප්‍රදායකි. ශාන්තිකර්ම සහ සමන් දේවාල පෙරහැර ඇසුරු කරගනිමින් අතීතයේ දී විකාසනය වූ මෙම සම්ප්‍රදායයේ ප්‍රාසංගික මුහුණුවර ක්‍රමිකව වර්ධනය ආරම්භ වන්නේ 1970 දශකයෙන් පසුව ය. එතැන් පටන් වර්තමානය දක්වා සබරගමු නර්තන සම්ප්‍රදායේ ප්‍රාසංගික මුහුණුවර ශාස්ත්‍රීය සහ ප්‍රාසංගික නර්තන ක්‍රමවේද ඔස්සේ ක්‍රමිකව වර්ධනය වෙමින් පවතී. ඕනෑ ම ශාස්ත්‍රීය නර්තන සම්ප්‍රදායක ප්‍රාසංගික මුහුණුවර පිළිබඳ අවධානය යොමු කිරීමට පෙර එහිලා වූ ශාස්ත්‍රීය සන්දර්භය හා ප්‍රායෝගික විෂය දැනුම පිළිබඳ මනා අවබෝධය වැදගත් වේ. වියතුන් රැසක් වරින්වර මෙම නර්තන සම්ප්‍රදාය ඉස්මතු කරලීමෙහිලා උත්සුක වූ බව පෙනී යයි. විවිධ හේතු නිසා අභාවයට යමින් පැවති සබරගමු නර්තන කලාව වර්තමානයේ ප්‍රචලිත වෙමින් පවතින නර්තන සම්ප්‍රදායක් බවට පත් වීමට එය ප්‍රබල හේතුවක් විය. පර්යේෂණ ගැටලුව වූයේ සබරගමු නර්තනයේ ප්‍රාසංගික මුහුණුවර කෙරෙහි එකී විෂය පද්ධතියේ සාම්ප්‍රදායික දැනුම සහ ප්‍රායෝගික කුසලතා භාවිතය සිදු කළ යුත්තේ කෙසේ ද? යන්න යි. සබරගමු නර්තන ක්ෂේත්‍රයේ ප්‍රාසංගික මුහුණුවර අධ්‍යයනය කිරීමේ දී වර්තමානයේ ඒ වෙනුවෙන් (උදාහරණ වන්නම් ඇසුරෙන්, ශාස්ත්‍රීය ගායන, ශාස්ත්‍රීය පද කොටස් ඇසුරෙන්) නිර්මාණය වූ නිර්මාණ අධ්‍යයන නැරඹීමත් (වීඩියෝපට), නිර්මාණ කාර්යයන්ට දායක වීමත්, ඒවායෙහි ශාස්ත්‍රීය සන්දර්භය අධ්‍යයනය කිරීමත්, එසේ ම ප්‍රාසංගික මුහුණුවර ඔප්නැංවීම සඳහා ඊට නිර්මාණකරණයෙන් මෙන් ම, සම්පත් දායකත්වය සැපයූ වත්මන් ශිල්පීන්, නිර්මාණකරුවන් සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීමත්, ඒ ඇසුරෙන් ලියැවුණු ලිඛිත සාධක අධ්‍යයන කිරීමත් මෙහිලා සිදුකරන ලදී. මෙම පර්යේෂණයේ දී නිරීක්ෂණය වූයේ සබරගමු නර්තන සම්ප්‍රදාය ඇසුරෙන් ප්‍රාසංගික නර්තන නිර්මාණයේ දී එම සම්ප්‍රදායේ ශාස්ත්‍රීය අවබෝධය සහ දැනුම අතිශය වැදගත් බව යි.

**ප්‍රමුඛ පද** - ප්‍රසංගික නර්තනය, සබරගමු වන්නම්, නිර්මාණකරණය, සම්ප්‍රදාය, ශාස්ත්‍රීය

[1] බාහිර කථිකාචාර්ය, සබරගමු නර්තන අධ්‍යයනාංශය, නර්තන හා නාට්‍ය කලා පීඨය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය nayanidanushka18@gmail.com

# Session 05

| ID | Topic | Author |
|---|---|---|
| **MU/IRS/A/18** | A Practical Study of the Peculiarities of Khyals by Pandit Ramdas Mishra (Bade Ramdas) of Banaras Gharana. | D.A.C. Atapattu |
| **MU/IRS/A/34** | සරච්චන්ද්‍ර නාට්‍ය සංගීත භාවිතාව | මහනාම වික්‍රමසිංහ |
| **MU/IRS/A/44** | ගාන සමය සංකල්පයට නව ප්‍රවේශයක් | ආර්. පී. මහින්ද සෙනෙවිරත්න |
| **MU/IRS/A/28** | A Study on How Relaxed Technical Approaches Affect Perceived Tension and Performance in Pianists | Pavithra M. Madapatha, Dr. Priyeshni P. Perera. |
| **MU/IRS/A/08** | ශ්‍රී ලාංකේය ජනප්‍රිය සංගීත ක්ෂේත්‍රයේ තාල 'නාමකරණය' | ඒ. එම්. චන්ද්‍රලාල් අමරකෝන් |
| **MU/IRS/A/33** | අවනද්ධාක්ෂරවල මහප්‍රාණ භාවිතය | හේමන්තා මනෝහාරි රන්දුනුගේ |

# A Practical Study of the Peculiarities of Khyals by Pandit Ramdas Mishra (Bade Ramdas) of Banaras Gharana.

**D.A.C. Atapattu** [1]

As a composer, a talented *guru*, and a *Hindustani* vocalist, Pandit Ramdas Mishra (Bade Ramdas) has done a significant contribution to Banaras *Gharana*. In examining the classical songs created by each vocal *Gharana* in India, the goal is to ensure the identity of the particular *Gharana* by demonstrating the unique characteristics of each *Gharana*. The research problem can be stated as "What are the unique characteristics and peculiarities of the Banaras *Gharana* displayed through the *Khyal* songs created by Pandit Ramdas?" The main aim of this research is to practically study and analyze the distinctive features of the *Khyal*s composed by Pandit Ramdas. This is a practice-based research. The *Khyals* related to various ragas composed by Pandit Ramdas were practically studied through this research and the various practical singing techniques used by him in composing those songs such as *kan*, *murki*, *gamak*, *andolan*, *meend*, *khatka*, etc., different compositions based on different *layakaris* (*Layadar Bandish* ex: *Tha Dugun Bandish*), melodious compositions, etc. were used as the basis for this research. The classical songs of Pandit Ramdas are very rare to find nowadays and the classical songs composed by Pandit Ramdas sung by his students Pandit Harishankar Mishra, Pandit Ganesh Prasad Mishra, Pandit Rajan Sajan Mishra, etc. are used to study the compositions of Bade Ramdas. Also, the books and articles written on Pandit Ramdas were used as sources to collect data for this research. *Khyals* composed by Pandit Ramdas are featured as *"Ramadasa ke Mohana Pyare, Ramadasa Vinthi Karata, Ramadasa ke Govinda Swami"* etc. It confirms that the song was composed by Pandit Ramdas. Most of the *khyal* songs created by Pandit Ramdas have a *taan* at the beginning and end of the *sthai* and at the end of the *antara*. Some songs are composed in *dugun*. In some songs, it is seen that the *sthai* is composed in *Trital* and the *antara* is made according to *ektal*. Many *Khyals* of Bade Ramdas are composed for God and most of the songs are very beautiful in terms of aesthetics.

**Keywords:** *Hindustani* Music, Banaras *Gharana*, *Khyal*, *Layadar Bandish*, *Tha Dugun Bandish*.

---

[1] Lecturer, Department of North Indian Music, Faculty of Music, University of the Visual & Performing Arts dacatapattu@gmail.com

# සරච්චන්ද්‍ර නාට්‍ය සංගීත භාවිතාව

**මහානාම වික්‍රමසිංහ** [1]

මනමේ සිංහබාහු හා ලෝම හංස යන නාට්‍යයන්හි එකිනෙකට වෙනස් වූ සංගීත භාවිතාවන් දැක්විය හැක. මනමේ හා සිංහබාහු නාට්‍ය ද්විත්වය සඳහා නාඩගම් තනු විවිධ ක්‍රමවේද අනුව යොදා ඇති ආකාරය හඳුනාගැනීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. පැරණි නාඩගම් තනු සඳහා නව පද රචනා යොදා එම චරිත එම අවස්ථාව නිරූපණය සඳහා ම යොදාගැනීම, පැරණි නාඩගම් තනු සඳහා නව පදරචනා යොදා වෙනත් චරිත සඳහා නාට්‍යෝචිත ලෙස භාවිත කිරීම, පැරණි නාඩගම් තනුවල රිද්ම රටා විවිධාකාරයෙන් වෙනස් කර උචිත අවස්ථා නිරූපණය සඳහා යොදාගැනීම, පැරණි නාඩගම් තනු ආභාස කොට ගෙන නව තනු නිර්මාණ යොදා අලංකරණය කිරීම දැකිය හැකි වන්නකි. ඉහත ක්‍රමවේද හතර මනමේ හා සිංහබාහු නාටක සඳහා භාවිත කර ඇති අතර, ලෝම හංස නාටකයේ දී අමරදේව විසින් නව තනු නිර්මාණය කර තිබෙනු දක්නට ලැබිණ. එහිදී සරච්චන්ද්‍රට අවශ්‍ය වූයේ නාඩගමත්, ඔපෙරාවත් අතර වන නිර්මාණයක් සකස් කරගැනීම ය. එහි දී බොහෝ විට හින්දුස්තානි රාග මෙන් ම නාඩගම් අංග ද, තබ්ලාව, කෝල් බෙර හා මද්දලය ද, විවිධ වූ කාෂ්ට තරංග හා නාඩ්‍ය තූර්ය වර්ග ද භාවිත වූ බව පෙනී යන්නකි. ඉහත නාට්‍ය තුන ම අයත් වන්නේ බේදාන්ත ගණයට බව ද නිගමනය කළ හැකි ය.

**ප්‍රමුඛ පද**

කෝල් බෙර, කාෂ්ට තරංග, නාඩ්‍ය තූර්ය, බේදාන්ත, ඔපෙරා

---

[1] ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, උත්තර භාරතීය සංගීත අධ්‍යයනාංශය, සංගීත පීඨය, සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය

# ගාන සමය සංකල්පයට නව ප්‍රවේශයක්

**ආර්. පී. මහින්ද සෙනෙවිරත්න**[1]

ගාන සමය සංකල්පය උත්තර භාරතීය සංගීතයට විශේෂ වූ සංකල්පයක් ලෙස සැලකේ. රාග ගායනයට හා වාදනයට සුදුසු වේලාව ගාන සමය නමින් හැඳින් වේ. වර්තමානය වන විට බොහෝ ඉදිරිපත් කිරීම් මෙම ගාන සමය සිද්ධාන්තයන්ගෙන් පරිබාහිරව සිදු වන ආකාරය දක්නට ලැබේ. ගාන සමය සඳහා දිනයේ කාලය බෙදා වෙන් කොට ඇති අතර, එම කාලය සඳහා වෙන් කරන ලද ථාටවලට අයත් රාග ද දක්වා තිබේ. මෙම ථාට අනුපිළිවෙළින් ගාන සමයට අනුව බෙදා දක්වා තිබේ ද යන්න මෙහි පර්යේෂණ ගැටලුව වේ. එකී ථාට නිසි ක්‍රමවේදයකට අනුව වර්ගකර දැක්වීම පර්යේෂණ අරමුණ වේ. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ මුද්‍රිත ලිපි ලේඛන, සම්මුඛ සාකච්ඡා, ශ්‍රව්‍ය දෘශ්‍ය තැටි පටි ඇසුරින් දත්ත එක් රැස් කෙරිණි. ථාට අනුපිළිවෙළට අනුව ගාන සමය තුළ රාග බෙදා දැක්වීම සිදු කොට ඇති බව මෙකී අධ්‍යයනයයේ දී අනාවරණය වූවකි.

**මුඛ්‍ය පදඃ** ගාන සමය, ස්වර, ථාට, හින්දුස්තානි සංගීතය

---

[1] ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, උත්තර භාරතීය සංගීත අධ්‍යයනාංශය, සංගීත පීඨය, සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය

# A Study on How Relaxed Technical Approaches Affect Perceived Tension and Performance in Pianists

**Pavithra M. Madapatha, Dr. Priyeshni P. Perera**[1]

The pianoforte is one of the most popular instruments which can be learnt at any age all over the world. Much of the music that had been composed for various keyboard instruments in different periods of history is often performed in the present-day acoustic piano. As a result, many music students who enroll in piano study are regularly at risk of acquiring poor technical approaches at the keyboard, which often leads to physical tension, continuous pain, injuries and a slower rate of progress. Therefore, this pilot study explored on relaxed technical concepts which may help pianists to be more efficient technically on their performances. The purpose of this research was to examine how the application of an appropriate technical concept to a technically challenging extract of a piece of music affects perceived physical tension of piano students. Also sought to determine whether the implementation of physically relaxed approaches aid in diminishing physical tension and increasing performance level of piano students. 26 undergraduates who are studying piano at the University of Visual and Performing Arts, Colombo, Sri Lanka participated for this research study. The technical approach termed "The Underwave and Overwave Motion", a relaxed technical approach of Otto Ortmann and Dorothy Taubman was applied to minimize the physical tension. Participants of this research study were required to perform and record their playing in 2 days and the music tracks were adjudicated by five judges. The collected data were statistically analyzed by Shapiro-Wilk W test to verify the relationship between the use of piano technique, performance and perceived tension. The perceived tension difference was computed based on the collected data as "Performance Difference = Day 1 Performance – Day 2 Performance and Perceived Tension Difference = Day 2 Perceived Tension – Day 1 Perceived Tension". Based on the results, the application of appropriate technical approaches to technically challenging extracts of music minimized the perceived physical tension and also improved the tone quality of the performance.

**Key words:** Piano techniques, Relaxed approach, Perceived tension, Taubman approach

[1] Department of Western Music, University of the Visual and Performing Arts

# ශ්‍රී ලාංකේය ජනප්‍රිය සංගීත ක්ෂේත්‍රයේ තාල 'නාමකරණය'

**ඒ. එම්. චන්ද්‍රලාල් අමරකෝන්** [1]

ගීත සඳහා භාවිත කරනු ලබන 'තාල රටා' නිර්මාණය කරගැනීම උදෙසා උත්තර භාරතීය තාල පද්ධතියේ තාල පදනම් වී ඇත. යේකාව ගීත සඳහා එලෙසින් ම භාවිත කරන අවස්ථා (උදාඃ-ඣප්තාලය, රූපක් තාලය, දාදරා තාලය) මෙන්ම තාලයට අදාළ මාත්‍රා බෙදීම පාදක කොටගෙන නිර්මාණයට ගැලපෙන පරිදි 'රිද්ම රටා' සකසා ගැනීමේ අවස්ථා ද ඇත. ලය අනුව තාලයේ නාමකරණය සිදුවන අවස්ථා ද දැකිය හැක (උදාඃ- රූපක් - දීප්චන්දි). සංගීත නිර්මාණ පටිගත කිරීම්වල දී මෙන්ම ප්‍රාසංගික ඉදිරිපත් කිරීම්වල දී ද ගීතයට අදාළ තාලය හින්දුස්තානී තාල නාමයකින් හැඳින්වීම හෝ බටහිර ක්‍රමයට (Time signature) හැඳින්වීම හෝ සිදු කරයි. 'ඣප්තාලය' මාත්‍රා දෙකක් සහ මාත්‍රා තුනක් වශයෙන් බෙදෙන මාත්‍රා දහයක තාලයකි. මෙම තාල රටාව ව්‍යවහාරික සංගීතයේ දී 5/8 (Five-Eight) ලෙස හඳුන්වයි. එහෙත් බටහිර තාල ක්‍රමය අනුව ඉහත දක්වන ලද ඣප් තාලයට අදාළ තාල රටාව 5/4 (Five-Four) නම් time signature විය යුතුය. මෙම ගැටලුව පිළිබඳ විමර්ශනය කිරීම පර්යේෂණය මඟින් සිදු කොට ඇත. ග්‍රන්ථ පරිශීලනය කිරීම හා සම්මුඛ සාකච්ඡා මඟින් පර්යේෂණයට අවශ්‍ය දත්ත රැස්කොට ඇත. දාදරා තාලයේ ගති ලක්ෂණ හා තාලය භාවිත කරන ලය අනුව (මධ්‍ය ලය) බටහිර තාල ක්‍රමය අනුව ¾ Beat (Time signature) ලෙස හැඳින්වීම නිවැරදි වේ. එසේම කෙම්ටෝ තාලය වාදනයේ දී ඇතිවන ගති ලක්ෂණ හා ලය අනුව (දෘත ලය) 6/8 Beat (6/8 Time signature) ලෙස හැඳින්වීම නිවැරදි වේ. ඒ අනුව ඣප්තාලය සඳහා 5/4 Time signature හා රූපක් තාලය හා දීප්චන්දි තාලය සඳහා 7/4 Time signature ලෙස හැඳින්වීම හෙවත් නාමකරණය සිදු විය යුතු බව මෙම පර්යේෂණයේ දී සනාථ විය.

**මුඛ්‍ය පද** :- තාල රටා, ජාති, ව්‍යවහාරික සංගීතය, බටහිර Time signature, ලය.

[1] ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, උත්තර භාරතීය සංගීත අධ්‍යයනාංශය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
amarakoon.c@vpa.ac.lk

# අවනද්ධාක්ෂරවල මහප්‍රාණ භාවිතය

**හේමන්තා මනෝහාරි රන්දුනුගේ** [1]

මිනිසා විසින් නිපදවාගත් ප්‍රථම වාද්‍ය භාණ්ඩය සේ සැලකෙන අවනද්ධයේ විකාසනයත් සමඟ එහි භාවිතාව සඳහා වාදන විධි, අක්ෂර, පද, ප්‍රස්තාර වැනි දෑ නිර්මාණය කරගැනිණ. මෙම පර්යේෂණයේ අරමුණ මෙම අවනද්ධ වාද්‍ය භාණ්ඩ සඳහා යොදාගත් අක්ෂර පිළිබඳ අධ්‍යයනයක යෙදීමත් එහි සුවිශේෂතා හඳුනාගැනීමත් ය. ක්‍රිස්තු පූර්ව 2 වන සියවසේ රචිත භරතමුණි නාට්‍යශාස්ත්‍රයේ ලෝකයේ පැරණිම භාණ්ඩ වර්ගීකරණය ආතෝද්‍ය යනුවෙන් හඳුන්වා ඇති අතර, එම වර්ගීකරණය තත, අවනද්ධ, සුෂිර හා ඝන වශයෙන් දක්වා ඇත. පසුකාලයේ කරන ලද සියලු වර්ගීකරණ සඳහා පදනම් වූයේ මෙම වර්ගීකරණයයි. එම වර්ගීකරණ තුළ 'අවනද්ධ' යන කුලකය ඇතුළත් ව ඇති අතර, අවනද්ධ යනුවෙන් සමින් වැසුණු යන අර්ථය දනවයි. පෙරදිග අවනද්ධ ඉතිහාසයේ අක්ෂර සම්බන්ධව දැක්වෙන ප්‍රථම සඳහන හමුවන්නේ ද භරතමුණි නාට්‍යශාස්ත්‍රයේ ය. නාට්‍ය සංගීතයේ දී භාවිත කරන ලදැයි දැක්වෙන ත්‍රිපුෂ්කර, දර්දර හා පණව යන අවනද්ධවල වාදනය කළ අක්ෂර 16 ක් එහි දැක්වේ. නාට්‍ය ශාස්ත්‍රයේ දැක්වෙන මෘදංගය සඳහා මහප්‍රාණ හා අල්පප්‍රාණ අක්ෂර භාවිත වී ඇතත්, එම අක්ෂර උච්ඡාරණය සඳහා භාවිත කළ අතර, වාදනයේ දී ප්‍රබලව මහප්‍රාණ අක්ෂර හෝ අල්පප්‍රාණ අක්ෂර ධ්වනියේ පවතින වෙනස ශ්‍රවණය නොවන්නට ඇත. පසුකාලයේ දී භාවිත කරන ලද මෘදංගම් වැනි භාණ්ඩ සඳහා මෙම මහප්‍රාණ අක්ෂර භාවිතය දක්නට නොලැබීම ද විශේෂත්වයකි. මෙම පර්යේෂණයේ ගැටලුව වන්නේ නාට්‍යශාස්ත්‍රයට පසු කාලයේ දී පැවති අවනද්ධ භාණ්ඩ සඳහා මෙම මහප්‍රාණ අක්ෂර භාවිත වූවා ද යන්න ය. 13 වන සියවසේ දී සිදු වූ මෝගල් බලපෑමෙන් අනතුරුව භාවිතයේ පැවති මෘදංගය වැනි භාණ්ඩ දක්ෂිණ භාරතීය සංගීතය සඳහා යොදා ගත් අතර, උත්තර භාරතයේ පැවති මෘදංගය යම් යම් වෙනස්කම් සහිතව පාර්සියානු බලපෑම් ද සමග එම සංගීත පද්ධතිය තුළ හැඳින්වූයේ පඛාවජ් යන නාමයෙනි. මුල් ස්වරූපයෙන් වෙනස් ස්වරූපයක් ගත් මෙම භාණ්ඩ සඳහා අනන්‍යතාවකින් යුත් වාදන ශෛලී ද නිර්මාණය විය. භාවිතයේ පවතින දේශීය හා භාරතීය අවනද්ධයන්හි භාවිතවන අක්ෂර ඇසුරින් මෙම පර්යේෂණය සිදු කළ අතර, පඛාවජ්, තබ්ලා වැනි අවනද්ධ භාණ්ඩ සඳහා භාවිත වන මිශ්‍ර අක්ෂර භාවිතාවේ දී ධ්වනිය පාදක කොටගෙන මහප්‍රාණ අක්ෂර භාවිතාව සිදු ව ඇති බව නිරීක්ෂණය විය. දේශීය හා භාරතීය අවනද්ධ ඇසුරින් කරන ලද පර්යේෂණයේ දී වර්තමානය වන විට භාවිතයේ පවතින අවනද්ධ භාණඩ සඳහා යොදාගන්නා අක්ෂරවල සුලභ භාවිතාව පවතින්නේ අල්පප්‍රාණ අක්ෂර වන අතර, මහප්‍රාණ දැක්වෙන අවනද්ධාක්ෂර හමුවන්නේ පඛාවජය හා තබ්ලාව වැනි භාණ්ඩවල දැක්වෙන මිශ්‍ර අක්ෂර ධ්වනි තුළ පමණි.

**ප්‍රමුඛ අක්ෂරඃ** අවනද්ධ, නාට්‍යශාස්ත්‍රය, අක්ෂර, භාරතීය අවනද්ධ, දේශීය අවනද්ධ

[1] උත්තර භාරතීය සංගීත අධ්‍යයනාංශය, සංගීත පීඨය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

# Session 06

| ID | Topic | Author |
|---|---|---|
| **MU/IRS/07** | ජන සංගීතයෙන් පිළිබිඹු වන ලාංකේය සංස්කෘතිය (ප්‍රේමය හා ලිංගිකත්වය ඇසුරින්) | වීරසිංහ මුදියන්සේලාගේ සෂිකා ලෝෂණි |
| **MU/IRS/08** | ජන සංගීත සම්ප්‍රදායෙන් ගිලිහෙන හේන් සැහැල්ල | ඩී. ඩබ්. මලීෂා මධුමිණි |
| **MU/IRS/09** | ශ්‍රී ලාංකේය ජන ක්‍රීඩාවන්හි අන්තර්ගත ගායන ශෛලි පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් | එච්. පී. එම්. සෙව්වන්දි |
| **MU/IRS/15** | කතලුව ගිනිවැල්ල පුරාණ විහාරයේ මතභේදාත්මක සිතුවම්කරණය පිළිබඳ අධ්‍යයනයක් | යූ. අයි. යූ. විමලධර්ම |
| **MU/IRS/16** | ප්‍රාග් ඓතිහාසික යුගයේ ශෛල පෘෂ්ඨීය පාදක කලාව තුළ හස්ති රූප භාවිතය. | එම්. ඩී. එස්. උප්පලවණ්ණා |
| **MU/IRS/21** | කැලණි විහාරයෙහි ඇති සෝලියස් මැන්දිස් චිත්‍ර ශිල්පියාගේ සිතුවම්වල කාන්තා රූව භාවිතය පිළිබඳ අධ්‍යයනය. | කේ. එම්. පී. ඒ. කළුපහන |

# ජන සංගීතයෙන් පිළිබිඹු වන ලාංකේය සංස්කෘතිය
# (ප්‍රේමය හා ලිංගිකත්වය ඇසුරින්)

**වීරසිංහ මුදියන්සේලාගේ සෂිකා ලෝෂණි** [1]

ජන සංගීතය මනුෂ්‍යය අත්දැකීම් කේන්ද්‍රගත ජීවිතයේ ප්‍රකාශනයන්හි ගායන මාධ්‍යය වේ. පරිකල්පනයෙන් සවිඥානිකව මෙහි ජන කවිය ශ්‍රවණ මාධ්‍යයෙන් පෝෂිතව විකාශනය වී ඇත. මානව ඓතිහාසික ජන සංගීතය සහ නූතන සංකලන ජන සංගීතය දක්වා ගමන්මග විමර්ශනයේ දී ප්‍රේමය හා ලිංගිකත්වය ඇසුරින් ලාංකේය සංස්කෘතිය සඳහා ජන සංගීතය ප්‍රමාණවත් මැදිහත්වීමක් සිදු කරයි. ජන සංගීතයෙන් මෙරට සංස්කෘතිය පිළිබිඹු වේ ද යන්න මෙම පර්යේෂණයේ ගැටලුව වේ. ජන කවියෙන් ගැමි ජනතාවගේ භෞතික අභෞතික සිතුම් පැතුම් පෘථුල පරාසයක් දක්වා දැඩි සංයමයකින් සහ ශෘංගාරාත්මකව ප්‍රකාශ කර ඇති අයුරු පර්යේෂණයේ විවරණ වේ. එකී ප්‍රස්තුත ලිංගිකත්වය සමග විග්‍රහ වන්නේ යෞවන හා අඹු - සැමි සම්බන්ධතා පිළිබඳ මනෝභාව මූලික වූ ජනකවි සමඟ ය. සිංහල ගීත සාහිත්‍යයට ද මෙකී විෂය පරාසය බලපා ඇති අයුරු පර්යේෂණය මගින් පැහැදිලි විය. මෙහි දී නෛසර්ගිකව පවතින ජන සංගීත ශෛලි හඳුනාගැනීම, එහි නව ප්‍රවණතා සමග සංස්කෘතික භාවිතය සහ අනන්‍යතාව නිරූපණය වන ආකාරය විමර්ශනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණු වේ. ප්‍රමාණාත්මක සහ ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේද යටතේ ද්විතීයික දත්ත ලෙස සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්නාවලි ද සමාජ නිරීක්ෂණ, ලිඛිත මූලාශ්‍ර පදනම් කරගන්නා ලදී. ජන සංගීතය සහ ලාංකේය සංස්කෘතික වපසරිය පර්යේෂණයේ නියැදිය යි. උපන්‍යාසගත විමර්ශනයේ දී ජන සංගීතය සංස්කෘතියේ අභිවෘද්ධිය උදෙසා උත්පන්න සංගීත අවධියේ සිට වර්තමානය දක්වා සමබර ස්වතන්ත්‍ර මාර්ගයක පැමිණ ඇත. ජන සංයුතිය (Population composition) සමඟ භේදනය වන්නා වූ කලාත්මක අනන්‍යතා සහ ජනශ්‍රැතිය ලාංකේය ජන සංස්කෘතියේ ප්‍රගමනය සඳහා සුබවාදීව බලපා ඇති අතර, එකී සංගීතමය බලපෑම ලාංකේය සංස්කෘතියේ ප්‍රායෝගික ජන ජීවිතයේ පිළිබිඹුවක් වෙමින් එය සමාජ විද්‍යාත්මක සහ සංස්කෘතික පදනමක් ගොඩනගන බව නිගමනය කළ හැකිය. දේශීය අනන්‍යතාව සහ කලාත්මක වර්ධනය උදෙසා සමාජ සංස්කෘතික අභියෝගවලට ජන සංගීතය පාත්‍ර කළ හැකි ය. මෙහි දී පළාත්බද ව සහ ප්‍රාදේශීයබද ව බිහි වූ, ව්‍යාප්ත නොවූ ජන නාද මාලාවන් පර්යේෂණාත්මකව සහ විමර්ශනාත්මකව අධ්‍යයනය කර හඳුන්වා දීමට මෙහිදී යෝජනා කෙරෙයි. අප්‍රකට ජන සංගීත ශෛලි සහ මූලාශ්‍රය සුරැකීම සඳහා විශ්වවිද්‍යාල සහ රාජ්‍ය අනුග්‍රහය ලබාගැනීම, ජන සංගීතය සංරක්ෂණය කිරීමත් එහි මූලාශ්‍රය අනාගතයට සුරක්ෂිත කිරීම සහ සංස්කෘතික අගය ලබාදීමත්, දේශීය විදේශීය මට්ටමින් ජන සංගීතය ව්‍යාප්තිය සඳහා සංගීතවේදීන් හා විද්‍යාර්ථීන්ගෙන් යෝජනා ලබාගැනීමට පර්යේෂණය මඟින් වැඩිදුරටත් යෝජිත ය.

**ප්‍රමුඛ පද** - ජන සංගීතය, ලාංකේය සංස්කෘතිය, පරිකල්පනය, ජනශ්‍රැතිය, ජන සංයුතිය

[1] නර්තන රංගකලා හා ඉතිහාස සිද්ධාන්ත අධ්‍යයනාංශය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
sashikaloshani123@gmail.com

# ජන සංගීත සම්ප්‍රදායෙන් ගිලිහෙන හේන් සැහැල්ල

**ඩී. ඩබ්. මලීෂා මධුමිණි** [1]

ගැමි ජනතාව තම වෘත්තීය පසුබිම තුළ නිරායාසයෙන් ගොඩනැගූ සිතුවිලි ජන සංගීතය හරහා ප්‍රකට විය. ගැමියාගේ දුෂ්කර ජීවන රටාව, සිතුම් පැතුම්, ස්වභාවධර්මය, ඇදහිලි හා විශ්වාස, භාෂාව, අත්දැකීම් ජන සංගීතය බිහිවීමෙහිලා මූලික වී ඇත. නූතනයේ හේන් සැහැල්ල නම් ජන සංගීත සම්ප්‍රදාය අභාවයට යමින් පැවැතීම පර්යේෂණයේ ගැටලුව වේ. එනිසා ම ඒවායේ වටිනාකම් ද ඉහළ සංස්කෘතික අගයක් ගනියි. ගෝලීයකරණය හමුවේ හේන් සැහැල්ල ජන ගායනා සංස්කෘතිය හරහා සංරක්ෂණය කිරීම පර්යේෂණයේ අරමුණු වේ. පර්යේෂණ ක්‍රමවේදය ලෙස, ලිඛිත හා අලිඛිත දත්ත උපයෝගි කරගනිමින් සිදු කරනු ලබයි. ලිඛිත දත්ත ලෙස පොත්පත්, සඟරා, අන්තර්ජාලය ද, අලිඛිත දත්ත ලෙස සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්නාවලී, ප්‍රාදේශීය සීමාවන් අනුව දත්ත ලබාගනු ලබයි. මෙම පර්යේෂණය මඟින් හේන් සැහැල්ල නම් වූ ජන සංගීත සම්ප්‍රදාය අභාවයට යාමට ප්‍රමුඛ හේතුව වී ඇත්තේ, නූතන තාක්ෂණය, සමාජ වාණිජකරණය සහ සමාජ ඉහළ යාම බව නිගමනය වේ. ඒ අනුව පාරම්පරික ජනයාගේ ජන ජීවිතය සමග බද්ධව සංරක්ෂණය වූ ජනශ්‍රැතික දැනුම ඉහත බලපෑම් මත අභාවයට ගොස් ඇති බව නිගමනය කළ හැකි ය. තත්කාලය සහ අනාගතය සඳහා මෙකී අප්‍රකට දැනුම නව මාධ්‍ය භාවිතය, විද්‍යුත් මාධ්‍ය, ලිඛිත මාධ්‍ය, පුළුල් කලාත්මක ප්‍රායෝගික ප්‍රකාශන හරහා ජනගත කිරීම හා සංරක්ෂණය සිදු කළ හැකි යැයි පර්යේෂණයෙන් යෝජිත ය.

**ප්‍රමුඛ පද** - ජන සංගීතය, හේන් සැහැල්ල, සංස්කෘතිය, ගෝලීයකරණය, ජන ජීවිතය

[1] නර්තන රංගකලා ඉතිහාසය සහ සිද්ධාන්ත අධ්‍යයනාංශය, සෞන්දර්යය කලා විශ්වවිද්‍යාලය
malishamadumini@gmail,com

# ශ්‍රී ලාංකේය ජන ක්‍රීඩාවන්හි අන්තර්ගත ගායන ශෛලි පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

**එච්. පී. එම්. සෙව්වන්දි** [1]

සිංහල ජන ක්‍රීඩා යනු සිංහල බෞද්ධ සංස්කෘතියේ අපූරු කැඩපතකි. ජන ක්‍රීඩා හා බැඳුණු හර පද්ධතියක් ඇත. ජනකෙළි උරුමය නිවැරදිව හඳුනාගන්නේ නම් එමඟින් නූතන තාක්ෂණික මුසුවක් මඟින් අපේ යටගියාවේ උරුමය නවමු ලෙස සමාජගත කළ හැකි ය. පත්තිනි දේවිය මුල් කරගනිමින් අං කෙළිය, පංච දැමීම වැනි ක්‍රීඩා යම් ඉතිහාස සිදුවීමක් මුල් කොට බිහිවී ඇත. ශ්‍රී ලාංකේය ජන ක්‍රීඩාවල අන්තර්ගත ගායන ශෛලි පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් සිදු කිරීමේ කාලීන වැදගත්කම මෙකී පර්යේෂණයෙහිලා හේතු පාදක වී ඇත. ශ්‍රී ලාංකේය ජන ක්‍රීඩාවල අන්තර්ගත ගායන ශෛලි ළමා මානසිකත්වය හා කුසලතා වර්ධනයට ඇති කරන බලපෑම කෙසේ ද යන්න මෙහි පර්යේෂණ ගැටලුව වේ. ජන ක්‍රීඩාවල අන්තර්ගත ගායන ශෛලි මඟින් ඉදිරිපත් කෙරෙන මානව විද්‍යාත්මක, මනෝ විද්‍යාත්මක හා සමාජ විද්‍යාත්මක තොරතුරු හෙළිකර ගැනීම මෙහි මුඛ්‍ය පරමාර්ථයයි. ජන ක්‍රීඩාවන්හි අන්තර්ගත ගායන ශෛලියක පවතින හඬ පරාසය දරුවකුගේ මානසික ආතතිය අවම කරගැනීම සඳහා බලපාන ආකාරය හඳුනාගැනීම සහ එහි භාෂා භාවිතය ළමා මනස හා කුසලතා වර්ධනයට ඉවහල් වන ආකාරය හඳුනාගැනීම පර්යේෂණයේ අරමුණු වේ. මෙහි දී ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය අනුගමනය කරන අතර, ද්විතීයික දත්ත ලෙස ලිඛිත මූලාශ්‍රය පොත් පත්, සඟරා, ලිපි ලේඛන, සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්නාවලි යනාදිය පර්යේෂණ කාර්යය සඳහා යොදාගැනේ. පර්යේෂණ නියැදිය ලෙස රාජගිරිය හේවාවිතාරණ විද්‍යාලයේ ප්‍රාථමික අංශයේ අහඹු ලෙස තෝරා ගත් දරුවන් විසිපස් දෙනෙකුගේ යුත් නියැදියක් ඇසුරෙන් දත්ත ලබා ගැණිනි. ජන ක්‍රීඩාවන් පිළිබඳ මීට පෙර පර්යේෂණ කෘති කිහිපයක් බිහිවී ඇත. ඒ මඟින් ජන ක්‍රීඩාවේ ජනශ්‍රැතික පසුබිම ඒ හා බැඳි සිරිත් විරිත් පිළිබඳ ගෙනහැර දක්වා ඇත. මෙහි දී නායකත්වය, පිල් බෙදීම ආදී කටයුතු තුළ සාමාජිකයින් තෝරා ගැනීමේදී ගල-මල බැලීම, බිම ඉරි ඇඳි ඉලක්කම් බෙදාගැනීම, ගණනය කිරීම වැනි ක්‍රියාකාරකම් මඟින් ශාරීරික හා බුද්ධිමය කුසලතා ගොඩනගා ගත හැකි ය. සම්මත රීති පද්ධතියක් තුළ ක්‍රියාකිරීම් තුළින් සමාජයේ ශික්ෂණය, ක්ෂණික තීරණ ගැනීම, තාක්ෂණික කුසලතා ක්‍රීඩක ක්‍රීඩිකාවන් තුළ නිරන්තරයෙන් පෝෂණය වේ. ශ්‍රී ලාංකේය ජන ක්‍රීඩාවන්හි අන්තර්ගත ගායන මඟින් ළමා මානසිකත්වය හා කුසලතා වර්ධනයට ප්‍රබල දායකත්වයක් ලබාගත හැකි බව නිගමනය කළ හැකිය.

**මුඛ්‍ය පද** - ජන ක්‍රීඩා, ගායන ශෛලිය, තාක්ෂණය, සිරිත් විරිත්, කුසලතා

[1] නර්තන රංගකලා ඉතිහාසය සහ සිද්ධාන්ත අධ්‍යයනාංශය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
malshasewwandi0824@gmail.com

# කතලුව ගිනිවැල්ල පුරාණ විහාරයේ මතභේදාත්මක සිතුවම්කරණය පිළිබඳ අධ්‍යයනයක්

**යූ. අයි. යූ. විමලධර්ම**[1]

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ අහංගම ප්‍රදේශයේ කතලුව ගිනිවැල්ල පුරාණ විහාරය පිහිටා ඇත. අතීතයේ සිට මේ දක්වා ම ලංකාව තුළ විහාර ආශ්‍රිත සිතුවම් කලාව විවිධ වූ වෙනස්කම්වලට ලක්වෙමින් විකාශනය වී ඇත. මෙම අධ්‍යයනය සිදුකිරීමේ දී කතලුව ගිනිවැල්ල පුරාණ විහාරයේ සිතුවම්කරණය සම්බන්ධව ජනතා විරෝධයක් එල්ල වූයේ මක් නිසාද යන්න මෙහි පර්යේෂණ ගැටලුවයි. 20 වන සියවස මුල් භාගයේ දී මෙරට විහාරවල විදේශීය ශිල්පීන් සිතුවම්කරණයේ යෙදුණ ද ඒවාට ජනතාවගේ ප්‍රසාදයක් මිස විරෝධයක් ඇති නොවීය. මෙරට ශාස්ත්‍රීය කලාවේ මෙන්ම බටහිර කලා ලක්ෂණ (පුනරුද) පිළිබිඹු කරන මෙම සිතුවම්වලින් බෞද්ධ වතාවරණයෙන් බැහැරවූ වඩාත් ශෘංගාරය කමාදික භාවයට නැඹුරු වූ බැවින් බෞද්ධ ජනයා තුළ මෙම සිතුවම් කෙරෙහි අපැහැදීම ඇති වූ බව විද්වද් අදහසයි. පර්යේෂණය සඳහා ද්විතීයික දත්ත රැස් කිරීමේ දී ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කළ අතර, දත්ත විශ්ලේෂණයට අනුව මෙම සිතුවම් නිර්මාණය කිරිමේ දී එම ශිල්පීන් හට මෙරට බෞද්ධ ජන සමාජයේ සිරිත් විරිත් හා සභ්‍යත්වය පිළිබඳ අවබෝධයක් නො තිබීමත් මෙම සිතුවම් පැවති සංස්කෘතික සමජීය හා ආගමික පසුබිමට නොගැලපීමත් මෙම ජනතා විරෝධයට හේතු ලෙස නිගමනය කළ හැක.

**ප්‍රමුඛ පද :** කතලුව ගිනිවැල්ල පුරාණ විහාරය, සිතුවම්කරණය, ජන සමාජය

[1] දෘශ්‍ය කලා පීඨය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය.

# ප්‍රාග් ඓතිහාසික යුගයේ ශෛල පෘෂ්ඨීය පාදක කලාව තුළ හස්ති රූප භාවිතය.

එම්. ඩී. එස්. උප්පලවණ්ණා[1]

ශ්‍රී ලාංකේය ප්‍රාග් ඓතිහාසික ශෛල පෘෂ්ඨ පාදක කලාව තුළ භාවිත වූ දෘශ්‍ය සත්ව සංකේත අතරින් හස්ති රූප සුවිශේෂී වේ. මෙම අධ්‍යයනයෙන් ප්‍රාග් ඓතිහාසික අවධියේ දී හස්ති රූ නිරූපිත පින්තාරු කිරීම්, කුරුටු ගෑම්, උත්කීර්ණ ආදි විවිධ ක්‍රමවේද දැකගත හැකිය. එම කලා නිර්මාණවල හස්ති රූපය නිරූපණය වීම මානවයන් ගේ අවට පරිසරයේ ඇස ගැටුණු සතුන් ඔවුන්ගේ ජීවන රටා හා දඩයම වැනි කාර්යයන් සමග ප්‍රබලව ම සම්බන්ධ වේ. මෙම පර්යේෂණයෙන් සාකච්ඡා කෙරෙන ගැටලුව වන්නේ ප්‍රාග් ඓතිහාසික යුගයේ ශෛල පෘෂ්ඨ පාදක කලාව නැතහොත් ගිරි කලාව තුළ හස්ති රූපවල ඉරියව් භාවිතය සහ නිර්මාණයේ ස්වභාවය කුමක් ද යන්නයි. ප්‍රාග් ඓතිහාසික යුගයේ සිතුවම් හමුවන ස්ථාන කේන්ද්‍රීයව තෝරාගත් (දොරවක ලෙන, තන්තිරිමලේ, වෙට්ටම්බුගල, කදුරුපොකුණ) නියැදියක් තුළින් ප්‍රාග් ඓතිහාසික මානවයා පරිසරයේ ප්‍රබලව ම ඇස ගැටුණු හස්ති රූප ගිරි පෘෂ්ඨ මත කෙලෙස නිරූපණය කළේ ද යන්න සහ ඔවුන්ගේ දෘශ්‍ය සංවේදීතාව කෙලෙස ඉදිරිපත් කළේ ද යන්න මෙයින් පරීක්ෂාවට ලක් කෙරේ.

**ප්‍රමුඛ පදඃ** ප්‍රාග් ඓතිහාසික යුගය, හස්ති රූප, ශෛල පෘෂ්ඨ, මානවයා, පරිසරය

[1] දෘශ්‍ය කලා පීඨය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

# කැලණි විහාරයෙහි ඇති සෝලියස් මැන්දිස් චිත්‍ර ශිල්පියාගේ සිතුවම්වල කාන්තා රුව භාවිතය පිළිබඳ අධ්‍යයනය.

**කේ. එම්. පී. ඒ. කළුපහන**[1]

(20) වන සියවසේදි නිර්මාණය කරන ලද කැලණි විහාරයෙහි සිතුවම් සෝලියස් මැන්දිස් මහතා ඉන්දියාවේ අජන්තා, එල්ලෝරා ආදි කලා නිර්මාණ මෙන් ම ලංකාවේ සීගිරිය හා තිවංක පිළිමගේ ආදි ස්ථාන පිළිබඳ අධ්‍යයනය කර ආසියානු සම්භාව්‍ය ශෛලිය අනුගමනය කරමින් නව ආරකින් නිර්මාණය කර ඇත. මෙම නව ආරක සිතුවම් කලාව පිළිබඳ අධ්‍යයනයේ දී සෝලියස් මැන්දිස් ශිල්පියාගේ සිතුවම්වල නිරූපිත කාන්තා රුව මෙහිදී සාකච්ඡා කරන්නා වූ ගැටලුව වේ. කැලණිය විහාරයේ සිතුවම් ස්ථානීය නිරීක්ෂණ මෙන්ම වෙනත් ද්විතීයික මූලාශ්‍රය මෙහිදී භාවිත කරන ලදී. එහිදි තෙරණිවරුන්, බිසෝවරුන්, කුමාරිකාවන්, දාසියන් වැනි විවිධ සමාජ ස්තරවල චරිත දැකගත හැකිවීම විශේෂත්වයකි. සිතුවමෙහි කාන්තා රූප භාවිතය අවම වුවත් තේමාවන් සඳහා නම් යෙදිමේ දී එම කාන්තාවන්ගේ නාමයට මුල් තැන දී ඇත.(සංඝමිත්තා තෙරණිය ශ්‍රී ලංකාවට ශ්‍රී මහා බෝධිය වැඩම කිරිම, සුජාතාව කිරිපිඩු පිළිගැන්වීම). එක් ප්‍රමුඛ කාන්තාවක් ප්‍රධාන කොටගෙන අදාළ කතා වස්තුව ඉදිරිපත් කිරිම විශේෂ වේ. මෙහි නිරූපිත සියලු කාන්තාවන් මනා අඟපසඟකින් යුක්ත ඉතා උසස් කුලවත් කාන්තාවන් වීම ද පෙන්වා දිය හැක. ඒ අතර දාසියන් ද සිටින අතර, ඔවුන් විශේෂිත වූ වස්ත්‍රාභරණයෙන් සරසවා සිත්තම් කර ඇත. එමගින් කුමන තරාතිරමක සිටියත් සෑම කාන්තාවක ම ගරු ගම්භීර ස්වභාවයකින් පෙන්වීමට උත්සහා දරා ඇති බව නිගමනය කළ හැක.

**ප්‍රමුඛ පද -** කැලණි විහාරය, සෝලියස් මැන්දිස්, සිතුවම්, කාන්තාව, දෘශ්‍ය කලාව

[1] දෘශ්‍ය කලා පීඨය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය.

# Session 07

| ID | Topic | Author |
|---|---|---|
| **MU/IRS/06** | හින්දුස්තානී රාගධාරී ස්වර ප්‍රස්තාර යතුරු ලියනය කිරීමේ දී විද්‍යාර්ථීන් විසින් මුහුණ දෙනු ලබන අභියෝග සඳහා ප්‍රතිකර්ම වශයෙන් පරිගණක මෘදුකාංගයක් සංවර්ධනය | **ජී. කේ. සුභාෂ්**<br>**එම්. ඒ. කේ. පී. කුමාරසිරි** |
| **MU/IRS/14** | MIDI (Musical Instrument Digital Interface) තාක්ෂණය මගින් සංගීත භාණ්ඩ වාදනය කිරීමේ ඇති ඵලදායිතාව පිළිබඳ අධ්‍යයනයක් | **ආර්. ඒ. වී. එස්. රණවක** |
| **MU/IRS/18** | Aspects and the effectiveness of music therapy on human behavior | **D. M. B. Bhagya** |

# හින්දුස්තානී රාගධාරී ස්වර ප්‍රස්තාර යතුරු ලියනය කිරීමේ දී විද්‍යාර්ථීන් විසින් මුහුණ දෙනු ලබන අභියෝග සඳහා ප්‍රතිකර්ම වශයෙන් පරිගණක මෘදුකාංගයක් සංවර්ධනය

**ජී. කේ. සුභාෂ් / එම්. ඒ. කේ. පී. කුමාරසිරි**[1]

ශ්‍රී ලංකාවේ පෙරදිග සංගීතය හදාරනු ලබන විද්‍යාර්ථීන් විසින් උත්තර භාරතීය සංගීත ප්‍රබන්ධ දෘශ්‍යමය ආකාරයෙන් දැක්වීම සඳහා භාත්ඛන්ඩේ ස්වර ලිපි පද්ධතිය භාවිත කෙරේ. පරිගණක ඇසුරු කරගනිමින් එකී ක්‍රමවේදයට අනුව ස්වර ලිපි සැකසීමේ දී ලාංකේය විද්‍යාර්ථීන් විසින් මුහුණ දෙනු ලබන අභියෝග හඳුනාගැනීමත්, එයට ප්‍රතිකර්ම වශයෙන් නව පරිගණක මෘදුකාංගයක් හඳුන්වාදීමත් මෙම අධ්‍යයනයේ මූලික අරමුණු වෙයි. ඒ අනුව පරිගණක ඇසුරු කරගෙන ස්වර ලිපි සැකසීමේ දී ලාංකේය විද්‍යාර්ථීන් විසින් මුහුණ දෙනු ලබන අභියෝග කවරේ ද? යන්න මෙම අධ්‍යයනයට අදාළ පර්යේෂණ ගැටලුව වේ. මෙය මිශ්‍ර පර්යේෂණ ප්‍රවේශය යටතේ සිදු කැරිණි. හින්දුස්තානී සංගීත ප්‍රස්තාරකරණය සහ අධ්‍යාපනික මෘදුකාංග සංවර්ධනය පිළිබඳ මූලික සංකල්ප අධ්‍යයනය සඳහා ග්‍රන්ථ මූලාශ්‍රය භාවිත කරනු ලැබූ අතර, පරිගණක ඇසුරෙන් ස්වර ප්‍රස්තාරකරණය සම්බන්ධ මින් පෙර සිදු කැරෙන ලද අධ්‍යයන පිළිබඳ දත්ත එක් රැස් කිරීමේ ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් සම්මුඛ සාකච්ඡා ද ද්විතීයික මූලාශ්‍රය වශයෙන් මුද්‍රිත, විද්‍යුත් ලේඛන මූලාශ්‍රය හා ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය ද භාවිත කැරිණි. පරිගණක ඇසුරෙන් ස්වර ලිපි රචනය සහ පිටපත්කරණය සම්බන්ධයෙන් විද්‍යාර්ථීන් විසින් මුහුණ දෙනු ලබන අභියෝග හඳුනාගැනීම සඳහා විවෘත ප්‍රශ්නාවලියක් ද යොමු කැරිණි. ඒ අනුව පවත්නා ක්‍රමවේද ඔස්සේ පරිගණක ආශ්‍රිත ප්‍රස්තාර පිටපත්කරණයේ දී වත්මන් විද්‍යාර්ථීන් විසින් මුහුණ දෙනු ලබන ප්‍රධාන අභියෝග වශයෙන් කාලය වැය වීම, දෝෂ සහිත වීම, පහසු අනන්‍ය ක්‍රමවේදයක් නොමැති වීම, සිත් ඇදගන්නා සුලු නිමාවක් නොමැති වීම හා වැයවන අධික පිරිවැය යනාදිය හඳුනාගනු ලැබිණි. එම අභියෝග සඳහා ප්‍රතිකර්ම වශයෙන් *'ස්වර මාලා'*; හින්දුස්තානී සංගීත ප්‍රස්තාර මෘදුකාංගය නිර්මාණය කරනු ලැබීය. ඒ අනුව තෝරීම් කවුළු කීපයක් ඔස්සේ භාවිත හින්දුස්තානී තාල අනුව ස්වයංක්‍රීය ව නිර්මාණය කරනු ලබන ප්‍රස්තාර සටහන් වඩාත් ආකර්ෂණීය, කාර්යක්ෂම හා පහසු ක්‍රමවේද ඔස්සේ අභිමතය පරිදි සංස්කරණය කිරීමෙන් අනතුරුව වඩා හොඳ නිමාවකින් යුතු ස්වර ලිපි ඡායාරූප ආකාරයෙන් සකසා ගැනීමේ හැකියාව හිමි වේ. ඒ අනුව ස්වර මාලා මෘදුකාංගය හින්දුස්තානී සංගීත ප්‍රස්තාර පිටපත්කරණයේ යෙදෙන විද්‍යාර්ථීන්ට මුහුණ දීමට සිදුවන අභියෝග සාර්ථක ලෙස ජය ගැනීමට සහාය දක්වන යෙදවුමක් ලෙස දැක්විය හැකි ය.

**ප්‍රමුඛ පද**

සංගීත ප්‍රස්තාරකරණය, පරිගණක මෘදුකාංග, සංගීත තාක්ෂණය, සංගීත පිටපත්කරණය

[1] සංගීත හා නිර්මාණාත්මක තාක්ෂණවේදය අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ අධ්‍යයනායතනය

# MIDI (Musical Instrument Digital Interface) තාක්ෂණය මඟින් සංගීත භාණ්ඩ වාදනය කිරීමේ ඇති ඵලදායිතාව පිළිබඳ අධ්‍යයනයක්

**ආර්. ඒ. වී. එස්. රණවක**[1]

VST Plugin (Virtual Studio Technology) යොදාගෙන MIDI තාක්ෂණය හරහා විවිධ සංගීත භාණ්ඩවල නාද උපදවාගැනීම වර්තමානයේ සුලබව දැකිය හැක. මෙලෙස වාදනය කිරීමේ ඇති ඵලදායිතාව පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණයි. MIDI තාක්ෂණය මගින් ලෝකයේ භාවිත වන විවිධ සංගීත භාණ්ඩවල නාද වාදනය කිරීම සාර්ථක ද යන්නත්, එසේ වාදනය කිරීමේ දී ඇතිවන වාසි අවාසි මොනවා ද යන්නත් සොයා බැලීම මෙම පර්යේෂණයේ අරමුණ විය. නූතනයේ MIDI තාක්ෂණය මඟින් පටිගත කිරීම් සිදු කරන ශබ්ද ඉංජිනේරුවන් සහ නිෂ්පාදකවරුන් සමඟ සිදුකරන සම්මුඛ සාකච්ඡා මඟින් සහ MIDI තාක්ෂණයෙන් වාදනය කළ සංගීත ඛණ්ඩ සහිත ගීත කිහිපයක් අධ්‍යයනය කිරීම මඟින් දත්ත රැස් කිරීමෙන් මෙම පර්යේෂණය සිදු කර ඇත. තාක්ෂණයේ දියුණුවත් සමඟ ශබ්ද ඉංජිනේරුවන් සංගීත භාණ්ඩ සජීවීව වාදකයෙකු ලවා වාදනය කර පටිගත කිරීම වෙනුවට VST Plugin යොදාගනිමින් එම සංගීත භාණ්ඩ වාදනයට හුරුව ඇත. එක් සංගීත භාණ්ඩයක් හෝ දෙක තුනක් පමණක් සජීවීව පටිගත කර අනෙකුත් සියලු නාදයන් VST Plugin හරහා උපදවා ගැනීමේ ප්‍රවණතාවක් දැකගත හැක. නමුත් විවිධ අවස්ථාවල MIDI තාක්ෂණය ඔස්සේ වාදනය කළ සංගීත භාණ්ඩවල නාදයන්ගේ ස්වභාවිකත්වය පිළිබඳ ගැටලු මතුවේ. එසේ වුවත් බොහෝ සංගීත නිෂ්පාදකවරුන් සංගීත භාණ්ඩයේ ස්වභාවික නාදයට ම සමාන ලෙස, MIDI ස්වර පුවරු මඟින් වාදන සිදු කිරීමට තරම් දක්ෂ වී ඇත. සංගීත තාක්ෂණයේ දියුණුවත් සමඟ ඇති වූ මෙවැනි පහසුකම්වලින් නිසි ප්‍රයෝජන ලබාගැනීමට නම් MIDI වාදන ශිල්පීන්ගේ ස්වර පුවරු වාදන හැකියාව සහ සංගීතමය දැනුම ඉහළ මට්ටමක පැවතිය යුතුය. ලොව පවතින විවිධ සංගීත සම්ප්‍රදායවලට අනුව සිදු කරනු ලබන තාක්ෂණික වාදන ශිල්ප ක්‍රම ඒ ආකාරයෙන්ම ස්වර පුවරුවකින් වැයීම තරමක් දුෂ්කර කාර්යයකි. නිදසුන් ලෙස ඉන්දියානු සංගීතයේ එන මීන්ඩ්, ගමක් වැනි ශිල්ප ක්‍රම පෙන්වා දිය හැක. එපමණක් නොව ඒ ඒ වාදන භාණ්ඩවලට අදාළ වාදන සම්ප්‍රදාය පිළිබඳ යම් අවබෝධයක් MIDI වාදන ශිල්පියා සතුව තිබිය යුතුය. එමෙන්ම මුල් යුගයේ මෙන් සියලුම සංගීත භාණ්ඩ ඒ ඒ වාදකයන් ගෙන්වා පටිගත කිරීමට ගතවන කාලයත්, ඔවුන් වෙනුවෙන් වැය කරන මුදලත් ඉතිරි වීම මෙන්ම, ස්වර පුවරුව මගින් සියලු සංගීත භාණ්ඩ වාදනය කරගැනීමට ඇති හැකියාව නිසා නිරායාසයෙන් ම නාද තාක්ෂණික කටයුතු පෙරට වඩා කාර්යක්ෂම වීමට VST සහ MIDI තාක්ෂණය හේතු වී ඇති බව ගම්‍ය වේ.

**ප්‍රමුඛ පද** :- MIDI, VST, ඵලදායිතාව, ශබ්ද ඉංජිනේරු, තාක්ෂණය

[1] උත්තර භාරතීය සංගීත අධ්‍යයනාංශය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය sachinthavenura@gmail.com

# Aspects and the effectiveness of music therapy on human behavior

**D. M. B. Bhagya**[1]

Music therapy is currently a relatively mature discipline and is also a relatively common form of therapy. The purpose of this research is to understand how music therapy can be helpful in eliminating negatie feelings and mental problems in students. Further is to understand how it impacts on university students' good personality as well. So, it can help university students overcome bad psychology and develop their psychology in a healthy direction. Mental health is one of the important indicators to measure the comprehensiveness of human quality and plays an important role in sustainable human development. Music therapy plays an important role in the mental health education of university students. As a fringe subject, music therapy combines music, medicine, and psychology, which is helpful in eliminating students' bad feelings and mental problems, and it helps university students build a good personality. Music therapy allows these students to release their feelings in an appropriate environment and atmosphere and then guide them in the right direction. Initially, colligative research method was used in this article and face to face interviews, books, journals, and a questionnaire, has been used as secondary data. University of the Visual and Performing Arts, Faculty of Music students were taken in to the sample for the collecting of data. This study presents the effectiveness of music therapy in the mental health education of university students and then presents important actions to promote the implementation of music therapy in the mental health education of university students in Sri Lanka.

**Key Word:** Music therapy, Human behavior, Education

[1] Department of Western Music , Faculy of Music, University of Visual and Performing Arts
bewmanidissanayake23@gmail.com

# Session 08

| ID | Topic | Author |
|---|---|---|
| **MU/IRS/A/14** | Notation writing system in the Field of Applied Music in Sri Lanka | **Kaludewa Sachintha Maduranga** |
| **MU/IRS/A/23** | මුද්‍රිත ප්‍රකාශන සඳහා සිංහල භාෂාවෙන් සංගීත ස්වර ප්‍රස්තාර පිරියෙසුමෙහිලා මතුවන ගැටලු | **සමිත රුක්මාල් සමරතුංග** |
| **MU/IRS/A/15** | Electro acoustic Music as an Abstract Art Form<br>(Producing Electro-acoustic compositions as an abstract Art of Music by using subdivided parts of tones of Sri Lankan Ethnic Musical Instruments) | **Charudaththe B. Illangasinghe.** |
| **MU/IRS/A/09** | The competence in classical music skills can be enriched through the process of continuous assessments: a study based on students of the faculty of music – UVPA | **E. M. I. Edirisooriya** |
| **MU/IRS/A/29** | කෘතිම බුද්ධිය භාවිතයෙන් මිනිස් මුහුණේ ඉරියව් සඳහා සංවේදී සංගීත ප්‍රතිචාර ක්‍රියාවලියක් නිර්මාණය කිරීම. | **ජේ. ඒ. යු. ප්‍රභාෂණී** |
| **MU/IRS/A/41** | සතත අභ්‍යාසයේ දී නිවැරදි හා විධිමත් තාක්ෂණික ක්‍රමවේද භාවිතය<br>(තබ්ලා වාද්‍ය භාණ්ඩය ඇසුරින්) | **පී. හරේන්ද්‍ර සුජිත් දේශප්‍රිය** |
| **MU/IRS/A/53** | උත්තර භාරතීය රාගධාරී සංගීත විෂයයීය සංයුක්ත සහ වියුක්ත සංකල්ප සාධනය<br>(ඕසබල් සහ බෲනර් විසින් ඉදිරිපත් කරන ලද “එලදායී ඉගෙනුම්” දැක්ම ඇසුරින්) | **යු. ඩබ්. ඒ. සිතාරා මධුෂාණි** |

# Notation writing system in the Field of Applied Music in Sri Lanka

**Kaludewa Sachintha Maduranga**[1]

